# මුදල් ප්‍රතිපත්ති වාර්තාව

## 2024 අගෝස්තු




ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

© ශ්‍රී ලංකා මහ බැංකුව

ISBN 978-624-5917-77-8

2024 අගෝස්තු 15

# පටුන

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව ....................4

සාරාංශය ....................6

1. මුදල් ප්‍රතිපත්ති සාරාංශය ....................8

2. උද්ධමනයේ සහ ආර්ථිකයේ ඉදිරි දැක්ම ....................9

2.1 මූලික පුරෝකථන ....................9
උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම ....................9
විශේෂ සටහන (අ): නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ උද්ධමන ඉලක්කය ....................13
මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ ඉදිරි දැක්ම ....................15

2.2 පුරෝකථන සඳහා පාදක වන ප්‍රධාන උපකල්පන ....................17
ගෝලීය පරිසරය ....................17
විදේශීය ජංගම ගිණුම ....................18

**2.3** පුරෝකථන මත පවතින අවදානම් ....................18
උද්ධමන පුරෝකථන මත පවතින අවදානම් ....................18
ආර්ථික වර්ධන පුරෝකථන මත පවතින අවදානම් ....................19

2.4 පෙර පුරෝකථන සමඟ සැසඳීම ....................21
මැදි කාලීන පුරෝකථන සඳහා භාවිතා කළ ප්‍රධාන උපකල්පන ....................21
උද්ධමනයේ හැසිරීම ....................22

3. වර්තමාන ආර්ථික තත්ත්වය ....................24

3.1 උද්ධමනය ....................24

3.2 මූර්ත අංශය ....................27

3.3 මුදල් අංශය ....................29
පොලී අනුපාතික ....................29
දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ....................31
දේශීය ණය තත්ත්ව සහ මුදල් සැපයුම ....................32

3.4 විදේශීය අංශය ....................35
ගෙවුම් තුලනය ....................35
විනිමය අනුපාතිකය ....................37
සංචිත වත්කම් ....................38

3.6 මූල්‍ය අංශය ....................41

3.5 ගෝලීය ප්‍රවණතා ....................44

# ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වනුයේ දේශීය මිල ස්ථායීතාව ළඟාකර ගැනීම සහ පවත්වාගෙන යාමයි. අඩු සහ ස්ථාවර මට්ටමක උද්ධමනය පවත්වා ගැනීම තුළින්, තිරසාර ආර්ථික වර්ධනයට සහ මහජනතාවගේ ආර්ථික සහ මූල්‍ය යහපැවැත්ම සඳහා මහ බැංකුව දායක වේ.

දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීමේ ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවයි. ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය, නම්‍යශීලී උද්ධමනය ඉලක්කකරණ රාමුවට අනුකූලව, මුදල් ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේ සහ නම්‍යශීලී විනිමය අනුපාත ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර ඇතිකරගත් මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම මගින් තීරණය කර ඇති ඉලක්කගත මට්ටමේ උද්ධමනය පවත්වා ගැනීම නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවේ අරමුණයි. 2023 ඔක්තෝබර් 5 වැනි දින රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමට අනුව, මහ බැංකුව කාර්තුමය මතුපිට උද්ධමනය සියයට 5ක මට්ටමක පවත්වා ගත යුතු වේ.[1]

උද්ධමන ඉලක්කය සපුරා ගැනීම සඳහා කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතික අපේක්ෂිත මාර්ගය ඔස්සේ හැසිරවීමට මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති උපකරණ භාවිතා කරයි. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික වේ. මුදල් වෙළඳපොළ එක්දින පොලී අනුපාතික හැසිරවීම සඳහා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය මගින් නිර්මාණය වූ පොලී අනුපාතික කොරිඩෝවක් පවතී. කෙටි කාලීන මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකයක් වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමුව යටතේ මෙහෙයුම් ඉලක්කය ලෙස ක්‍රියා කරයි. මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව පවත්වා ගෙන යන එක්දින පොලී අනුපාතික මූල්‍ය වෙළඳපොළ හරහා ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වන අතර, එය අවසානයේ උද්ධමනය කෙරෙහි බලපෑම් ඇති කරයි.

මුදල් ප්‍රතිපත්ති තීරණ දත්ත මත පදනම් වේ. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් උද්ධමනය කෙරෙහි පූර්ණ බලපෑමක් ඇති කිරීමට කාලය ගතවන බැවින්, මුදල් ප්‍රතිපත්ති තීරණ ඉදිරි දැක්මක් සහිත විය යුතුය. සුදුසු මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තීරණය කිරීම සඳහා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වසරකට හය වරක් රැස්වේ. මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය උද්ධමනය සහ උද්ධමන ඉදිරි දැක්ම, පවත්නා දත්ත මත පදනම් වූ ආර්ථිකයේ වත්මන් තත්ත්වය සහ ඉදිරි දැක්ම, පුරෝකථනයන් සහ පුරෝකථනයන් ආශ්‍රිත අවදානම් සහ අවිනිශ්චිතතා ඇගයීමක් සිදු කරයි. මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් අභ්‍යන්තර තාක්ෂණික කමිටුවක් වන මුදල් ප්‍රතිපත්ති කමිටුව, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සලකා බැලීම සඳහා තාක්ෂණික නිර්දේශ සපයයි.

[1] අංක 2352/20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් උද්ධමන ඉලක්කය මහජනතාවට සන්නිවේදනය කරන ලදී. කාර්තුමය මතුපිට උද්ධමනය යනු අනුරූප කාර්තුවේ මාස තුන තුළ මාසික කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස් වීමේ සරල සාමාන්‍යයයි.

මහ බැංකු පනතෙහි 27 සහ 80 වගන්ති සපුරාලීම සඳහා මුදල් ප්‍රතිපත්ති වාර්තාව සකස්කර ඇති අතර, මහ බැංකු පනතට අනුව උද්ධමනයේ මෑත කාලීන හැසිරීම, උද්ධමනය සඳහා මුල් වූ හේතු සාධක, උද්ධමනය සඳහා වන මැදි කාලීන පුරෝකථන, එවැනි පුරෝකථන සඳහා ඇති ප්‍රධාන අවදානම් මෙන්ම මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම විස්තර කෙරෙන ද්විවාර්ෂික වාර්තාවක් මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය වේ. මීට අමතරව, මෙම වාර්තාව මගින් ආර්ථිකයේ අනෙකුත් විවිධ අංශවල වත්මන් ප්‍රවණතා මහජනතාවට සන්නිවේදනය කරන අතර ම, ආර්ථික වර්ධනයේ ඉදිරි දැක්ම සහ ඒ ආශ්‍රිත අවදානම් පිළිබඳ තක්සේරුවක් සපයයි.

# සාරාංශය

2023 වසරේ දී ක්‍රමිකව ඇති වූ ආර්ථික ස්ථාවරත්වය තුළින්, 2024 වසරේ මේ දක්වා කාලය තුළ ආර්ථිකය යළි නඟා සිටුවීමෙහිලා සැලකියයුතු ප්‍රගතියක් අත්කර ගැනීමට ශ්‍රී ලංකාව සමත් වී ඇත. විශේෂයෙන්ම මෑත දී වාර්තා වූ ඉතිහාසයේ ඉහළම උද්ධමන කාලපරිච්ඡේදයෙන් අනතුරුව, ජනතාව සහ ව්‍යාපාර කටයුතු කෙරෙහි යම් සහනදායී බවක් සහ නිශ්චිතතාවක් ඇති කරමින් උද්ධමනය අඩු මට්ටමක පැවතුණි. දේශීය ආර්ථික කටයුතු අඛණ්ඩව වැඩිදියුණු විය. අඩු උද්ධමන පීඩන හා සමගාමීව මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය අඛණ්ඩව ලිහිල් ස්ථාවරයක පවතී.

බදු සංශෝධන හේතුවෙන් 2024 වසර මුල් කාලයේ දී ඉහළ යෑමක් පෙන්නුම් කළ මතුපිට උද්ධමනය, ඉන් අනතුරුව සැලකිය යුතු ලෙස පහත වැටුණි. විදුලිය ගාස්තු, ඉන්ධන සහ එල්.පී ගෑස් මිල සැලකියයුතු ලෙස අඩු කරමින් කෙරුණු මිල සංශෝධන මෙන්ම ආහාර උද්ධමනය මන්දගාමී වීම මෑත කාලීනව වාර්තා වූ අඩු උද්ධමනය සඳහා හේතු විය. මීට අමතරව, මුදල් තත්ත්වයන් වඩාත් ලිහිල්ව පැවතිය ද, වැය කළ හැකි ආදායම අඩු මට්ටමක පැවතීම හේතුවෙන් ඉල්ලුම මගින් ඇති වන පීඩන බොහෝ දුරට අවම විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසරේ මැද භාගය වනවිට උද්ධමනය, එහි ඉලක්කගත සියයට 5ක අගයට වඩා සැලකිය යුතු ලෙස අඩු මට්ටමකට පහත වැටුණි. කෙසේවෙතත්, විශේෂයෙන් ම මැදි කාලය සඳහා උද්ධමන අපේක්ෂා මනාව පාලනය වී පවතී.

මෑතක දී විදුලිය ගාස්තු සහ දේශීය ඉන්ධන මිල ගණන් පහළ දැමීම හේතුවෙන් ඉදිරි මාස කිහිපය තුළ මතුපිට උද්ධමනය ඉලක්කගත මට්ටමට වඩා සැලකියයුතු ලෙස අඩු මට්ටමක පවතිනු ඇතැයි පුරෝකථනය කෙරේ. ඒ අනුව, කෙටි කාලීනව මතුපිට උද්ධමනයේ කාර්තුමය සාමාන්‍යය මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමේ සඳහන් ප්‍රතිශතාංක 2.0ක ආන්තිකයට වඩා වැඩි අගයකින් පහළ යෑමේ හැකියාවක් පවතී. මේ අතර, ඉහළ විචලන සහිත වියදම් කාණ්ඩ ඉවත් කළ සහ ඒ හේතුවෙන් ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පෙන්නුම් කරන මූලික උද්ධමනය කෙටි කාලීනව මතුපිට උද්ධමනයට වඩා ඉහළ යා හැකි වුවද, එය මතුපිට උද්ධමනයට වඩා අඩු විචලනයක් පෙන්නුම් කරනු ඇතැයි පුරෝකථනය කර ඇත. තවද, සැපයුම් අංශයේ බලපෑම් ක්‍රමයෙන් අවම වෙනු ඇතැයි අපේක්ෂිත අතර, මතුපිට උද්ධමනය 2025 වසරේ මැද භාගය වනවිට ඉහළ ගොස් ඉන් අනතුරුව, සුදුසු ප්‍රතිපත්ති සහායෙන් මැදි කාලීනව ඉලක්කගත මට්ටමේ ස්ථායී වනු ඇත.

2024 වසරේ මේ දක්වා කාලය තුළ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ දී මහ බැංකුව සුපරික්ෂාකාරී ප්‍රවේශයක් අනුගමනය කළේය. උද්ධමනය ඉලක්කගත මට්ටමට වඩා අඩු මට්ටමක පැවතීම, උද්ධමන අපේක්ෂා නොවෙනස්ව පැවතීම සහ විදේශීය අංශයේ පීඩන අවම මට්ටමක පැවතීම යන තත්ත්වයන් මධ්‍යයේ වුවද, උද්ධමනය මෑත කාලීනව පහත වැටීමට සැපයුම් අංශයේ සාධක බොහෝ දුරට හේතු වූ බැවින් මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ දී ප්‍රවේශම්කාරී විය. මහ බැංකුවේ ලිහිල් මුදල් ප්‍රතිපත්තිය හා අනුකූලව වෙළඳපොළ පොලී අනුපාතික 2024 වසරේ පළමු භාගය තුළ දී අඛණ්ඩව පහළ ගියේය.

සාර්ව ආර්ථික ස්ථායීතාව ක්‍රමයෙන් යළි තහවුරුවීමත් සමඟ, 2023 වසරේ තුන්වන කාර්තුවේ සිට මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.යේ) ධන වර්ධනයක් වාර්තා කරමින් ආර්ථිකය සැලකියයුතු ලෙස යථා තත්ත්වයට පත්විය. වැඩි දියුණු වන ආයෝජක අපේක්ෂා, ලිහිල් මුදල් තත්ත්ව, සහ විදේශීය ඉල්ලුම් තත්ත්ව ක්‍රමයෙන් වර්ධනය වීම මෙන්ම, පසුගිය වසරේ වාර්තා වූ ආර්ථික සංකෝචනය හේතුවෙන් ඇති වූ අඩු සංඛ්‍යානමය පදනම් බලපෑම ආර්ථිකයේ මෙම යථා තත්ත්වයට පත්වීම සඳහා දායක වූ ප්‍රධාන සාධක විය. පෞද්ගලික අංශයට සපයන ණයෙහි වර්ධනය තවමත් තිරසාර මට්ටමකට ළඟා වී නොමැත. ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ වෙළඳපොළ ණය අනුපාතික අඩුවීම තුළින් ඉදිරි කාලයේ දී පෞද්ගලික අංශයට ණය සැපයීම දිරිමත් වනු ඇත. ශ්‍රී ලංකා ආර්ථිකයේ මෙම වර්ධන ප්‍රවණතාව නුදුරු කාලයේ දී අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂිත අතර, මැදි කාලීනව එහි උපරිම ධාරිතාව කරා ක්‍රමයෙන් ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

උද්ධමන පුරෝකථනවලට අදාළ අවදානම් සලකා බැලීමේදී, ගෝලීය සහ දේශීය වශයෙන් පවතින සැපයුම් අංශයේ අවිනිශ්චිතතා හේතුවෙන් මතුපිට උද්ධමනය පුරෝකථන කළ මට්ටමට වඩා ඉහළ යෑමේ අවදානම් පැවතුණද, අපේක්ෂිත ඉලක්කයට වඩා අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවත්, මැදි කාලීනව උද්ධමන පුරෝකථන සඳහා අවදානම් තුලිතව පවතී. මූර්ත ද.දේ.නි.යේ වර්ධන පුරෝකථන සැලකූවිට, කෙටි කාලීනව සහ මැදි කාලීනව වර්ධන පුරෝකථන සඳහා අවදානම් තුලිතව පවතී. ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක වීම සහ ක්‍රියාත්මකවන සාර්ව ආර්ථික ප්‍රතිපත්ති විශාල වශයෙන් ආපසු හැරවීමක් සිදු නොවන බවට උපකල්පනය කරමින් ඉහත ආර්ථික ඉදිරි දැක්ම සහ අවදානම් ඉදිරිපත් කර ඇත.

*මෙම වාර්තාවේ අන්තර්ගතය, 2024 ජූලි මස 24 වැනි දින සිදු කළ මුදල් ප්‍රතිපත්ති නිවේදනය සමඟ නිමාවට පත් වුණු ශ්‍රී ලංකා මහ බැංකුවේ 2024 ජූලි මාසයේ මුදල් ප්‍රතිපත්ති තීරණ වාරය වනවිට පැවති දත්ත මත මූලික වශයෙන් පදනම් වේ.*

# 1. මුදල් ප්‍රතිපත්ති සාරාංශය

ශ්‍රී ලංකා මහ බැංකුව 2023 ජූනි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව අඛණ්ඩව සිය ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමට කටයුතු කළේය. උද්ධමන පීඩන පහළ මට්ටමක පැවතීම හේතුවෙන් 2024 වසරේ මේ දක්වා කාලය තුළදී ද මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කරන ලදී.

2023 වසරේ අවසාන භාගයේ දී මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 650කින් සැලකිය යුතු ලෙස පහළ දැමීමට කටයුතු කළේය. සමස්ත ඉල්ලුම් තත්ත්ව අඩු මට්ටමක පැවතීම, නුදුරු කාලීන හිතකර උද්ධමන තත්ත්ව, මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා මෙන්ම විදේශීය අංශයේ අධික පීඩනයක් නොමැති වීම මධ්‍යයේ 2024 මාර්තු මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50කින් තවදුරටත් අඩු කරන ලදී. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් සමස්ත වෙළඳපොළ ණය පොලී අනුපාතිකවල අඛණ්ඩ පහළ යෑමක් සිදුවිය. වෙළඳපොළ පොලී අනුපාතික පහළ යෑම සඳහා අවකාශය සලසමින් මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික කෙටි කාලයක් සඳහා නොවෙනස්ව පවත්වා ගෙන ගිය අතර, ඉන් පසුව 2024 ජූලි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික තවදුරටත් අඩු කිරීමට තීරණය කළේය. හිතකර උද්ධමන ඉදිරි දැක්මත් සමඟ, ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව ඉදිරියට පවත්වා ගෙන යන බවට සංඥා කිරීම සහ වෙළඳපොළ ණය පොලී අනුපාතික තවදුරටත් අඩු වීමට පෙළඹවීම අරමුණු කරගනිමින් 2024 ජූලි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 25කින් අඩු කරමින් මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කරන ලදී. උද්ධමන පීඩන අවම වීම මධ්‍යයේ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම සඳහා සහාය වීමට ඉදිරි කාලය තුළදී මුදල් ප්‍රතිපත්තිය ප්‍රමාණවත් ලෙස ලිහිල්ව පවත්වාගැනීමේ මහ බැංකුවේ ස්ථාවරය මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගය මගින් පෙන්නුම් කෙරේ.

2024 වසරේ ඉතිරි කාලය තුළ දී මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය 2024 සැප්තැම්බර් සහ නොවැම්බර් මාසවල දී රැස්වීමට නියමිතය.

**පසුගිය මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කිරීමේ සිට ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති තීරණ**

**(2024 පෙබරවාරි - 2024 ජූලි)**

| 2024 මාර්තු | 2024 මැයි | 2024 ජූලි |
|---|---|---|
| ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50කින් 8.50%ක් (නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය) සහ 9.50%ක් (නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය) දක්වා අඩු කරන ලදී. | ප්‍රතිපත්ති පොලී අනුපාතික 8.50% (නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය) සහ 9.50% (නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය) යන මට්ටමේ නොවෙනස්ව පවත්වාගෙන යන ලදී. | ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 25කින් 8.25% (නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය) සහ 9.25% (නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය) දක්වා තවදුරටත් අඩු කරන ලදී. |

**මුදල් ප්‍රතිපත්ති විවරණ මාධ්‍ය නිවේදන සඳහා QR කේතය භාවිතා කරන්න**

# 2. උද්ධමනයේ සහ ආර්ථිකයේ ඉදිරි දැක්ම

උද්ධමනය සහ මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ පුරෝකථන කෙරෙහි අවධානය යොමු කරමින්, 2024 වසරේ ජූලි මාසයේදී එළඹුණු මුදල් ප්‍රතිපත්ති තීරණයට සහාය දැක්වීම සඳහා මහ බැංකු කාර්යමණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ මෙම කොටසේ දක්වා ඇත.[2] මෙම පුරෝකථන මගින්, 2024 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති විවරණයේදී පැවති දත්ත, ප්‍රධාන විචල්‍යයන්හි නුදුරු කාලීන පුරෝකථන, ගෝලීය සාර්ව ආර්ථික පුරෝකථන, සහ උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරෙන අතර, ඒවා මෙම වාර්තාවෙහි මූලික පුරෝකථන (baseline forecast) ලෙස සැලකේ.

## 2.1 මූලික පුරෝකථන

2024 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති විවරණයේදී මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථනවලට අනුව, උද්ධමනය නුදුරු කාලීනව තවදුරටත් පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෑත කාලීනව සිදු කරන ලද විදුලි ගාස්තු සැලකිය යුතු ලෙස පහළ දැමීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වන අතර, විශේෂයෙන් 2024 වසර අවසානයේදී සහ 2025 වසර ආරම්භයේදී පවතින, හිතකර පදනම් බලපෑම ද ඊට දායකවනු ඇත. ඉන් අනතුරුව, ප්‍රධාන වශයෙන් අහිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම හේතුවෙන්, 2025 දෙවන භාගයේදී මතුපිට උද්ධමනය තාවකාලිකව ඉහළ යෑමක් අපේක්ෂා කරන අතර, මැදි කාලීනව එය සියයට 5ක (වාර්ෂික ලක්ෂ්‍යමය) ඉලක්කගත මට්ටමේ ක්‍රමයෙන් ස්ථායී වනු ඇත.මේ අතර, සුදුසු ප්‍රතිපත්තිවල සහාය ඇතිව ආර්ථික වර්ධනය යථා තත්ත්වයට පත් වීම මැදි කාලීනව අඛණ්ඩව සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම

උද්ධමනය පිළිබඳ නවතම පුරෝකථනයන්ට අනුව, වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය ඉදිරි මාස කිහිපය තුළ පහළ යෑමක් අපේක්ෂා කරන අතර, මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමේ සඳහන් පරිදි මතුපිට උද්ධමනයේ කාර්තුමය සාමාන්‍යය සියයට 5ක ඉලක්කගත උද්ධමනයට වඩා පහළ මට්ටමක නුදුරු කාලීනව පැවතිය හැකි අතර, එය ගිවිසුමේ සඳහන් ප්‍රතිශතාංක 2ක ආන්තිකයකට වඩා වැඩි විය හැකිය. 2024 වසරේ දෙවන කාර්තුව තුළ වාර්තා වූ මතුපිට උද්ධමනයේ කාර්තුමය සාමාන්‍යය ද, ඉලක්කගත උද්ධමනයට වඩා ප්‍රතිශතාංක 2ක ආන්තිකය ඉක්මවා පහළ යැම හේතුවෙන්, අඛණ්ඩව උද්ධමනය කාර්තු දෙකක් තුළ ප්‍රතිශතාංක 2ක ආන්තිකයකට වඩා වැඩි මට්ටමක පැවතීම මත, මහ බැංකු පනතෙහි 26(5) වගන්තියට අනුව, 2024 වසරේ තෙවන කාර්තුවේදී පළමු වරට ඉලක්කගත උද්ධමන මට්ටම කඩවීමක් විය හැකි බව පුරෝකථන මගින් පෙන්නුම් කෙරේ. දැනට පවතින තොරතුරු සහ පුරෝකථනවලට අනුව, 2024 වසරේ සිව්වන කාර්තුවේදී සහ 2025 වසරේ පළමු කාර්තුවේදීද එවැනි ඉලක්කගත මට්ටම කඩවීමක් තවදුරටත් සිදුවිය හැකිය. මතුපිට උද්ධමනය පහළ

[2] මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් අර්ධ ව්‍යුහාත්මක සාර්ව ආර්ථික ආකෘතියක් වන කාර්තුමය පුරෝකථන ආකෘතිය (Quarterly Projection Model-QPM) භාවිතා කරනු ලැබේ. සෑම මුදල් ප්‍රතිපත්ති වාරයකදීම මෙම පුරෝකථන යාවත්කාලීන කරනු ලබන අතර, ඒ සඳහා, වෙනත් මූලාශ්‍ර අතර, ගෝලීය සාර්ව ආර්ථික පුරෝකථන සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන මාසික උද්ධමන දත්ත නිකුත් කිරීම් සහ දළ දේශීය නිෂ්පාදිතයේ කාර්තුමය දත්ත නිකුත් කිරීම් ද ඇතුළුව, නවතම ආර්ථික ප්‍රවණතා පිළිබඳ දත්ත සහ තොරතුරු භාවිතා කෙරේ.

**01 රූප සටහන: මතුපිට උද්ධමනයේ පුරෝකථනය (කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)**

***2024 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව***




මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

*උද්ධමන ව්‍යාප්ති සටහනෙහි 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ.*

**සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ**

2024 වසරේ ජූලි මාසයේ මුදල් ප්‍රතිපත්ති විවරණයේදී පැවති දත්ත, උපකල්පන සහ විනිශ්චයන් පුරෝකථන මගින් පිළිබිඹු කරයි. ගෝලීය බලශක්ති සහ ආහාර මිල පිළිබඳ වන පුරෝකථන; ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වන ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ආර්ථික වර්ධනය; ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ පුරෝකථන අනුව අපේක්ෂිත දේශීය රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම; සහ ඇමරිකා එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මගින් නිරූපණය වන ගෝලීය මූල්‍ය තත්ත්ව යනාදී කරුණු මත මෙම පුරෝකථන රඳා පවතී. තවද, ආර්ථික ආකෘති මගින් ලබාදෙන පොලී අනුපාතික මාර්ගය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන සාර්ව ආර්ථික ක්‍රියාමාර්ග මත පුරෝකථන රඳා පවතී. තවද, මූලික පුරෝකථනවලදී ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවලින් විශාල වශයෙන් විතැන් වීමක් අපේක්ෂා නොකෙරේ. එබැවින්, ජා.මූ. අරමුදලේ-විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යෑම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා සහ ණය ප්‍රතිව්‍යුහගතකරණ ප්‍රයත්න මෙයට අදාළ වේ. මෙම උපකල්පනවල සිදුවන සැලකිය යුතු මට්ටමේ වෙනස්කම් සැබෑ උද්ධමනය පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැකිය. මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන, උද්ධමන ව්‍යාප්ති සටහන් සමඟින්, එක් එක් මුදල් ප්‍රතිපත්ති වාරය තුළ අඛණ්ඩව යාවත්කාලීන කෙරේ. අස්ථාවර ගෝලීය පරිසරය සහ දේශීය ආර්ථිකයේ සහ දේශපාලන පරිසරයේ ඇති අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගනිමින්, මූලික පුරෝකථන, පුරෝකථනය කරන ලද මට්ටම්වලට වඩා ඉහළ යෑම සඳහා මෙන්ම පහළ යෑම සඳහා අවදානම් පැවතිය හැකිය. මූලික පුරෝකථනයට ඇති අවදානම් පිළිබඳ විස්තර "පුරෝකථන මත පවතින අවදානම්" කොටසේදී සාකච්ඡා කෙරේ.

යෑමට විශාල වශයෙන් දායක වනුයේ මෑතකදී විදුලි ගාස්තු සැලකිය යුතු ලෙස පහළ දැමීමයි. උද්ධමනයේ ගතික බලපෑම අවම වීම මධ්‍යයේ, 2024 වසරේ මුල් භාගයේදී එකතු කළ අගය මත බදු වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වීමෙන් ඇතිවූ පදනම් බලපෑම්[3] මගින් උද්ධමනය පහළ යෑමෙන්, මතුපිට උද්ධමනය 2025 වසරේ මුල් භාගයේ පුරෝකථන කාලසීමාව තුළදී එහි පහළම මට්ටම වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතරම, මෑත කාලීන විදුලි ගාස්තු සංශෝධන තුළින් ඇතිවන අඩු මිල මට්ටම් හේතුවෙන්, වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සාපේක්ෂව අඩු සංඛ්‍යානමය පදනමක් මත ගණනය කරනු ඇති හෙයින්, 2025 වසරේ දෙවන භාගය දක්වා උද්ධමනය මෙම සංඛ්‍යානමය බලපෑම හේතුවෙන් තාවකාලිකව වැඩි විය හැකි අතර, ගෝලීය ආහාර මිල වඩා වේගයෙන් ඉහළ යෑම, ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ක්‍රමයෙන් අවප්‍රමාණය වීමේ

[3] පදනම් බලපෑම සහ ගතික බලපෑම පිළිබඳ වැඩිදුර කරුණු සඳහා, කරුණාකර රූප සටහන 03 සමඟ ඇති පාදසටහන 5 බලන්න.

බලපෑම[4] සහ ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් ඇති විය හැකි ඉල්ලුමේ බලපෑම ද උද්ධමනයේ මෙම ඉහළ යෑම තවදුරටත් තීව්‍ර කරනු ඇත. කෙසේ වෙතත්, 2025 වසරේ අග භාගයේ උද්ධමනය ඉහළ යෑමට ප්‍රධාන හේතුව වන සංඛ්‍යානමය පදනම් බලපෑම පසුව ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කරන බැවින් මෙම තත්ත්වය තාවකාලික වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මැදි කාලීනව, මතුපිට උද්ධමනය සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ ගෝලීය ඛනිජතෙල් හා ආහාර උද්ධමනය යථා තත්ත්වයට පත්වීමේ සහාය ඇතිව ඉලක්කගත සියයට 5ක මට්ටමට ක්‍රමයෙන් ස්ථායී වී එම මට්ටම වටා පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**02 රූප සටහන: මූලික උද්ධමනයේ පුරෝකථනය (කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)**

***2024 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව***




මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

*උද්ධමන ව්‍යාප්ති සටහනෙහි 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ.*

ඉහත රූප සටහන **01** හි පැහැදිලි කිරීමේ සටහන බලන්න.

උද්ධමනයේ සංරචක සලකා බලන විට, බලශක්ති හා ප්‍රවාහන ආශ්‍රිත වියදම් ඇතුළු නිතර මිල උච්චාවචන සහිත භාණ්ඩ හා සේවා ඉවත් කර ගණනය කරනු ලබන, ආර්ථිකයේ මූලික ඉල්ලුම් පීඩන මනිනු ලබන පුළුල් මිනුමක් ලෙස සාමාන්‍යයෙන් සලකනු ලබන මූලික උද්ධමනය 2024 වසරේ දෙවන භාගයේ යම් පමණකින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. අපේක්ෂිත දේශීය ඉල්ලුම් තත්ත්වයන් යථා තත්ත්වයට පත්වීම සහ ගෝලීය ආහාර උද්ධමනයේ අපේක්ෂිත වැඩිවීම මූලික උද්ධමනය මෙසේ ක්‍රමයෙන් ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක වේ.

[4] ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා මධ්‍යයේ විදේශීය ණය ආපසු ගෙවීමට අදාළ පිටතට ගලා යෑම් පිළිබඳ අපේක්ෂාවන්, ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සහ ණය වර්ධනය ඉහළ යෑම සමඟ ආනයන මට්ටම් ඉහළ යෑම් සහ, අවප්‍රමාණය වීමේ දිගු කාලීන ප්‍රවණතාවට අනුකූලව, ආර්ථික ආකෘතිය මගින් ශ්‍රී ලංකා රුපියල ක්‍රමයෙන් අවප්‍රමාණය වීමක් පුරෝකථනය කෙරේ.

**03 රූප සටහන: මතුපිට උද්ධමනය: මිලෙහි ගතික බලපෑම හා පදනම් බලපෑම [5] (කො.පා.මි.ද., 2021=100)**




මූලයන්: මහ බැංකු කාර්ය මණ්ඩල ගණනය කිරීම්

මතුපිට උද්ධමනය පහළ යෑමට හේතු වූ බලශක්ති සහ ප්‍රවාහන මිල මට්ටම්, මූලික උද්ධමන දර්ශකයෙන් බැහැර කරන බැවින්, මතුපිට උද්ධමනයේ වත්මන් සහ අපේක්ෂිත පහළ යෑම මූලික උද්ධමනය තුළ පිළිබිඹු නොවේ. කෙසේ වෙතත්, 2024 වසරේ මුල් භාගයේදී එකතු කළ අගය මත බදු ඉහළ නැංවීම හේතුවෙන් මූලික උද්ධමන පැසෙහි බොහෝ අයිතමවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, විශේෂයෙන් 2025 වසරේ මුල් භාගයේදී මතුපිට උද්ධමනය මෙන්ම මූලික උද්ධමනය ද, සංඛ්‍යානමය පදනම් බලපෑමට ලක්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, මූලික උද්ධමනය 2025 වසරේ මුල් භාගයේදී තාවකාලික අඩුවීමක් අපේක්ෂා කරන අතර, ඉන් පසුව අඩු උච්චාවචනයක් සහිතව සාපේක්ෂව ස්ථායීව පවතිනු ඇත. මතුපිට උද්ධමනය හා සැසඳීමේදී මූලික උද්ධමනය තුළ දක්නට ලැබෙන උද්ධමනය දිගු කාලයක් අඛණ්ඩව පැවැතීමේ තත්ත්වය මෙයට හේතුවයි.

[5] උද්ධමනය සාමාන්‍යයෙන් මනිනු ලබන්නේ මිල මට්ටමේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනසක් ලෙසය. එනම්, පෙර වසරේ අදාළ කාල පරිච්ඡේදයට සාපේක්ෂව මිල දර්ශකයකින් මනිනු ලබන, දී ඇති කාල පරිච්ඡේදය සඳහා වූ මිල මට්ටමේ ප්‍රතිශත වෙනස් වීමයි. (ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කළ, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීමට භාවිතා කරන ප්‍රධාන මිල දර්ශක දෙක වන කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද. සම්පාදනය කර ප්‍රකාශයට පත් කරයි.) කෙසේ වෙතත්, මිල තොරතුරු සාමාන්‍යයෙන් මාසිකව ප්‍රකාශයට පත් කරනු ලබයි. එබැවින්, මාසිකව ද ලක්ෂ්‍යමය පදනමින් මිල වෙනස් වීම් ගණනය කළ හැකිය. එක් මාසයක සිට ඊළඟ මාසය දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ වෙනස් වීම වත්මන් මාසයේ මාසික ලක්ෂ්‍යමය උද්ධමනයෙන් පෙර වසරේ අනුරූප මාසයේ මාසික ලක්ෂ්‍යමය උද්ධමනය අඩු කිරීමෙන් දළ වශයෙන් ගණනය කළ හැකිය. (ප්‍රතිශත වෙනස්වීමට ලඝු වෙනස්වීම් ආසන්න වශයෙන් සමාන වීම මෙම අසන්න කිරීම භාවිතා කිරීමට හේතුවේ.) ඒ අනුව, වත්මන් මාසයේ මාසික ලක්ෂ්‍යමය උද්ධමනය සාමාන්‍යයෙන් ගතිකතාව ලෙස හඳුන්වනු ලබන අතර, එය ආර්ථික ප්‍රවණතා හේතුවෙන් නවතම මාසයේ වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය වෙනස් වන ආකාරය නිරූපණය කරයි. මේ අතර, පෙර වසරේ අනුරූප මාසයේ මාසික ලක්ෂ්‍යමය උද්ධමනයේ සෘණ අගය පදනම් බලපෑම ලෙස හැඳින්වෙන අතර, එයින් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය එක් මාසයක සිට ඊළඟ මාසය දක්වා වෙනස් වන ආකාරය කෙරෙහි බලපාන සංඛ්‍යානමය බලපෑම පිළිබිඹු වේ. (එනම්, $\pi_t^{\text{වාර්ෂික ලක්ෂ්‍යමය}} \approx \pi_{t-1}^{\text{වාර්ෂික ලක්ෂ්‍යමය}}$ + ගතිකතාව + පදනම් බලපෑම; මෙහි $\pi$ මගින් උද්ධමනය නිරූපණය කරයි). මෙම වෙන් කිරීම ලක්ෂ්‍යමය උද්ධමනයේ වෙනස්වීම්වලට හේතු සාධක ඇගයීමට විශ්ලේෂකයින්ට ඉඩ සලසයි. මහ බැංකුවේ කාර්තුමය පුරෝකථන ආකෘතියෙන් ලබා දෙන පුරෝකථන වැනි කාර්තුමය තොරතුරු භාවිතා කරන විට, ගතිකතාව සහ පදනම් බලපෑම වශයෙන් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය වර්ගීකරණය කිරීම, කාර්තුමය ලක්ෂ්‍යමය උද්ධමනය භාවිතයෙන්ද කළ හැකිය. තවද, මෙම ආසන්න කිරීම උද්ධමනයට පමණක් සීමා නොවන අතර ඕනෑම විචල්‍යයක වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස්කම් වෙන් කිරීමට යොදා ගත හැකිය.

## විශේෂ සටහන (අ): නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ උද්ධමන ඉලක්කය

**හැඳින්වීම**

ශ්‍රී ලංකා මහ බැංකුව වර්තමානයේදී නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව හා අනුකූලව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරයි. වර්තමානයේදී **උද්ධමන ඉලක්කය 5%කි.** පැහැදිලි උද්ධමන ඉලක්කයක් පැවතීමෙන් ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ගේ උද්ධමන අපේක්ෂාවන්ට මඟ පෙන්වීම සහ මිල ප්‍රවණතා පුරෝකථනය කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරෙන අතර, එමගින් ව්‍යාපාරික ආයතන සහ කුටුම්භයන් වෙත වඩා හොඳින් පුරෝකථන සිදු කිරීම සඳහා පහසුකම් සැලසීමට මෙන්ම මුදල් ප්‍රතිපත්ති විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමට සහාය වනු ඇත. උද්ධමන ඉලක්කයක් පිහිටුවීමට අවශ්‍ය වන මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව; අදාළ ව්‍යවස්ථාපිත පසුබිම; උද්ධමන ඉලක්කය; සහ එම ඉලක්කය කඩවීම නිර්වචනය කෙරෙන ආකාරය කෙටියෙන් සාකච්ඡා කිරීම මෙම ලිපියෙන් අපේක්ෂා කෙරේ.

**මුදල් ප්‍රතිපත්ති රාමුවේ විකාශය**

පෙර පැවති ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමයට වෙනුවට, ශ්‍රී ලංකාවේ මුදල් අධිකාරිය ලෙස 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ 1950 වසරේදී මහ බැංකුව පිහිටුවනු ලැබීය. ආරම්භයේ දී, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව ස්ථාවර විනිමය අනුපාතිකයක් මත පදනම් විය. 1977 ආර්ථික ලිහිල්කරණයෙන් පසුව සහ ගෝලීය ප්‍රවණතාවන්ට අනුකූලව, 1980 දශකයේ මුල් භාගය වන විට, මහ බැංකුව විනිමය අනුපාතික ක්‍රමයෙන් ඉවත් වී මුදල් සමස්ත ඉලක්ක කිරීම වෙත යොමු විය (Weerasinghe, 2018). මුදල් ප්‍රතිපත්ති නවීකරණ මුලපිරීම් 2000 දශකයේ දී ආරම්භ වූ අතර, මුදල් ඉලක්කකරණය සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යන ද්විත්වයේම අංග ඇතුළත් වැඩි දියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවක් 2015 වසරේ සිට අනුගමනය කෙරිණි (ශ්‍රී ලංකා මහ බැංකුව, 2019a, 2023). 2020 වසරේ සිට මහ බැංකුව විසින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස යොදා ගනු ලැබුව ද, ඒ සඳහා අවශ්‍ය නීතිමය පසුබිම ලැබුණේ 2023 වසරේදීය.

**නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීම**

ආර්ථිකයේ සහ මහ බැංකුකරණයේ වෙනස්වන ස්වභාවයට සරිලන පරිදි, මුදල් නීති පනත වෙනුවට 2023 අංක 16 දරන මහ බැංකු පනත 2023 වසරේ සැප්තැම්බර් මාසයේදී නීතිගත කරන ලදී. නව පනත නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසන බොහෝ විධිවිධානවලින් සමන්විත වේ. මහ බැංකු පනත නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස විධිමත් වශයෙන් පිළිගනී. විශේෂයෙන්ම, මහ බැංකු පනතෙහි 11(1) වගන්තියට අනුව, දේශීය මිල ස්ථායීතාව ළඟා කර ගැනීම සහ පවත්වා ගැනීම සඳහා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව මුදල් ප්‍රතිපත්ති සැකසීම සහ නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සතු වේ.

උද්ධමන ඉලක්කකරණ රාමුවක් තුළ ප්‍රකාශිත සංඛ්‍යාත්මක උද්ධමන ඉලක්කයක්, උද්ධමන පුරෝකථනයක් කෙරෙහි අවධානය යොමු කරන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සහ ඉහළ විනිවිදභාවය සහ වගවීම ඇතුළත් වේ (Svensson, 2010). විනිවිදභාවයෙන් යුත් සහ විශ්වසනීය උද්ධමන අරමුණක් පැවතීම දිගුකාලීන උද්ධමන අපේක්ෂාවන් පාලනය කිරීම සඳහා උපකාර වන බව ඊට අදාළ පර්යේෂණ ලිපි සහ ග්‍රන්ථ මගින් පැහැදිලි වේ (Gürkaynak et al., 2007). ෆෙඩරල් සංචිතයේ හිටපු සභාපති බෙන් බර්නැන්කිට අනුව, උද්ධමන අපේක්ෂාවන් සැබෑ උද්ධමනයට බෙහෙවින් බලපෑම් ඇති කරයි (Bernanke, 2007). උද්ධමන අපේක්ෂාවන් බොහෝ විට උද්ධමනය සාක්ෂාත් කර ගැනීමට දායක වන බැවින්, අපේක්ෂාවන් පාලනය කිරීමෙන් සැබෑ උද්ධමනයට බලපෑම් ඇති කළ හැකිය. ඒ අනුව, උද්ධමනය ඉලක්ක කිරීම මුදල් ඉලක්කයකට වඩා මහජනතාවට අවබෝධ කර ගැනීමට පහසු වේ. එපමණක් නොව, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී උද්ධමන අනුපාතිකය වැනි බොහෝ දෙනෙකුට පහසුවෙන් තේරුම් ගත හැකි, නිරන්තරව සහ පොදු ජනතාවට ලබා ගත හැකි දර්ශකයක් භාවිතා කිරීමෙන්, තොරතුරු සම්බන්ධයෙන් මහ බැංකුව සහ මහජනතාව අතර ඇති පරතරය අවම කිරීමට ද එය උපකාරී වන අතර, එමගින් විනිවිදභාවය සහ වගවීම ඉහළ නැංවීමට පහසුකම් සලසයි (Weerasinghe, 2018). ලොව පුරා උද්ධමනය ඉලක්ක කරගත් බොහෝ මහ බැංකු දැඩි උද්ධමන ඉලක්කකරණයට වඩා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය අනුගමනය කරයි. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය මගින් උද්ධමනය සහ මූර්ත ආර්ථිකය යන දෙකම ස්ථාවර කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර, දැඩි උද්ධමන ඉලක්කකරණය මූර්ත ආර්ථිකයේ ස්ථායිතාවය පිළිබඳ නොසලකා උද්ධමනය කෙරෙහි පමණක් අවධානය යොමු කරයි (Svensson, 2009). ශ්‍රී ලංකාව පිළිබඳව සලකා බැලීමේ දී , මහ බැංකු පනතෙහි 6(1) වගන්තිය මගින් දේශීය මිල ස්ථායිතාවය අත්කර ගැනීම සහ පවත්වා ගැනීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික පරමාර්ථය බවට නියම කෙරෙන අතර, එමගින් උද්ධමනය ස්ථායී කිරීමේ වැදගත්කම තහවුරු කෙරේ. එමෙන්ම, මහ බැංකු පනතෙහි 6(4) වගන්තියට අනුව, මහ බැංකුව විසින් සිය මූලික අරමුණ කරා යැමේ දී, වෙනත් කරුණු අතර, ආර්ථිකය එහි විභව මට්ටම කරා ස්ථායී කිරීම සැලකිල්ලට ගත යුතු අතර, ඒ හරහා 11(1) වගන්තියේ පිළිගෙන ඇති පරිදි විධිමත් ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සඳහා නීතිමය අවකාශය සැකසේ.

**මහ බැංකු පනතට අනුව උද්ධමන ඉලක්කය**

මහ බැංකු පනතෙහි 26(1) වගන්තියට අනුව ළඟා කර ගත යුතු උද්ධමන ඉලක්කය නියම කරමින් මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමකට අත්සන් කළ යුතු වේ. ඒ අනුව, 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී මෙම අවශ්‍යතාවය සපුරාලමින් ගිවිසුමක් අත්සන් කරන ලද අතර, එය අංක 2352/20 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධියට පත් කර ඇත . මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමට අනුව, මහ බැංකුව විසින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො. පා. මි. ද.) මත පදනම් වූ කාර්තුමය මතුපිට උද්ධමන අනුපාතිකය 5% ඉලක්කයක පවත්වා ගත යුතු වේ.[†] ශ්‍රී ලංකා මහ බැංකුව

සහ රජය විසින් ප්‍රමාණාත්මක උද්ධමන ඉලක්කයක් ඒකාබද්ධව තීරණය කිරීමෙන් රට තුළ අඩු සහ ස්ථායී උද්ධමන අනුපාතයක් ළඟා කර ගැනීම සඳහා පාර්ශ්ව දෙකෙහිම කැපවීම පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, මහජනතාව වෙත වගකීම් සහගතව ක්‍රියා කරන අතරම මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා ස්වාධීනව කටයුතු කිරීමට මහ බැංකුවට නිදහස ලබා දී ඇත. එසේ කිරීමේ දී, මහ බැංකුව උද්ධමන ඉලක්කය සපුරාලීම අරමුණු කරගත් සිය උපාය මාර්ග සහ තීරණ පිළිබඳ මහජනතාවට තොරතුරු සපයයි. විනිවිදභාවය සඳහා වූ මෙම කැපවීම මගින් අනාගත මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ අවිනිශ්චිතතාව අවම කිරීමට සහ මහ බැංකුවේ විශ්වසනීයත්වය ඉහළ නැංවීමට උපකාරී වේ.

මහ බැංකු පනතෙහි 26(5) වගන්තියට අනුව අඛණ්ඩව කාර්තු දෙකක් සඳහා උද්ධමන ඉලක්කය එකඟ වූ ආන්තිකයකින් සපුරා ගැනීමට මහ බැංකුව අපොහොසත් වුවහොත්, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුව වෙත ඒ පිළිබඳ ව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වන අතර, එය මහජනතාවට ද ලබා ගත හැකි විය යුතු ය. මෙම කාර්යය සඳහා, මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමෙන් ප්‍රතිශතාංක ±2ක සමමිතික ආන්තිකයකට එකඟ වේ. ඒ අනුව, ළඟා කරගත් කාර්තුමය මතුපිට උද්ධමනය ඉලක්කයට ඉහළ මට්ටමින් හෝ පහළ මට්ටමින් 5% ඉලක්කයෙන් අඛණ්ඩව කාර්තු දෙකක් තුළ සියයට 2ක ප්‍රතිශතාංකයකට වඩා වැඩි ප්‍රමාණයකින් වෙනස් වන්නේ නම් ඉලක්ක කඩවීමක් සිදු වනු ඇත (උපකල්පිත උද්ධමනය සමඟ ඉලක්ක කඩවීමක නිදසුනක් අ.1 රූප සටහනෙහි දක්වා ඇත). මහ බැංකු පනතෙහි 26(5) වගන්තියට අනුව ඉලක්ක කඩවීමක් සිදුවුවහොත් ඉදිරිපත් කළ යුතු වාර්තාව මගින් උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට අපොහොසත් වීමට හේතු, මහ බැංකුව විසින් ගත යුතු යෝජිත පිළියම් ක්‍රියාමාර්ග සහ උද්ධමන ඉලක්කය සපුරා ගත යුතු කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් ඇතුළත් විය යුතු ය.

† එවැනි උද්ධමන ඉලක්කයක් සඳහා සහාය ලබා දෙන කරුණු කිහිපයක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව (2019b) බලන්න.

අ.1 රූප සටහන: ඉලක්ක කඩවීම් පිළිබඳ තෝරාගත් උපකල්පිත උදාහරණ කිහිපයක්




මූලය: මහ බැංකු කාර්ය මණ්ඩල ගණනය කිරීම්

**මූලාශ්‍ර:**


1. Bernanke, B.S. (2007). *Inflation Expectations and Inflation Forecasting*. [Online] [Accessed 01 August 2024] Available from: https://www.federalreserve.gov.
2. Central Bank of Sri Lanka (2019a). *A Primer on the Conduct of Monetary Policy and Central Banking in Sri Lanka: Past, Present and Future*, Information Series Note. [online] [Accessed 07 August 2024] Available from: https://www.cbsl.gov.lk.
3. Central Bank of Sri Lanka (2019b). 'Box 09: Choice of the Inflation Target for Flexible Inflation Targeting (FIT) in Sri Lanka', In *Central Bank of Sri Lanka Annual Report 2018*. pp.243–246.
4. Central Bank of Sri Lanka (2023). 'Box 03: Highlights of the Central Bank of Sri Lanka Act', In *Central Bank of Sri Lanka Annual Report 2022*. pp.34–36
5. Gürkaynak, R.S., Levin, A.T., Marder, A.N. and Swanson, E.T. (2007). 'Inflation Targeting and the Anchoring of Inflation Expectations in the Western Hemisphere', *FRSB Economic Review*, pp.25–47.
6. Svensson, L.E.O. (2009). *Flexible Inflation Targeting – Lessons from the Financial Crisis*. [Online] [Accessed 05 August 2024] Available from: https://www.bis.org.
7. Svensson, L.E.O. (2010). 'Inflation Targeting', In *Handbook of Monetary Economics*, Vol. 3, pp. 1237-1302.
8. Weerasinghe, P.N. (2018). 'Evolution of Monetary and Exchange Rate Policy in Sri Lanka and the Way Forward', *Central Bank of Sri Lanka - Staff Studies*, 48(1), pp. 1-19.

නුදුරු කාලීනව බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මිල ගණන් ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීමක් අපේක්ෂා කරන අතර, එමගින් මතුපිට උද්ධමනය මැදි කාලීනව ඉලක්කගත මට්ටම කරා ඉහළ යෑමට දායක වේ. ගෝලීය බනිජතෙල් මිලෙහි අපේක්ෂිත ක්‍රමයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවය සහ ශ්‍රී ලංකා රුපියල ක්‍රමයෙන් අවප්‍රමාණය වීමට ඇති හැකියාව මෙම හැසිරීම මගින් බොහෝ දුරට පිළිබිඹු කරයි. පවතින අස්ථාවර භූ-දේශපාලන පරිසරය මධ්‍යයේ බනිජතෙල් මිල ක්‍රමයෙන් ඉහළ යෑමක් මූලික පුරෝකථනයෙහි උපකල්පනය කෙරේ. කෙසේ වෙතත්, මෑත කාලයේ දී දක්නට ලැබුණු බනිජතෙල් මිල ගණන්වල අස්ථායී හැසිරීමෙන් පිළිබිඹු වන පරිදි, මෙම තත්ත්ව සම්බන්ධයෙන් ඇති අවිනිශ්චිතතාවය ඉතා ඉහළය. ගෝලීය මිල මට්ටම්වල ක්‍රමයෙන් ඉහළ යෑම සම්ප්‍රේෂණය වීමත් සමඟ බලශක්ති සහ ප්‍රවාහන අංශවලට අදාළ දේශීය මිල ගණන් මත යම් පීඩනයක් ඇතිවිය හැකි අතර, බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය දැනට පවතින අඩු මට්ටම්වල සිට යථා තත්ත්වයට පත්වීම සඳහා එය දායක වනු ඇත. තවද, විශේෂයෙන් ම කිහිපවරක් සැලකිය යුතු ලෙස මිල පහළ දැමීම් අනුක්‍රමයෙන් ඇති වූ බැවින්, ඊළඟ වටයන්හි දී විදුලි ගාස්තුවල සිදු විය හැකි යම් ඉහළ දැමීම් මගින් ද මෙම පුරෝකථනය කරන ලද මාර්ගයට බලපෑම් ඇති කරනු ඇත. මීට අමතරව, නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ උද්ධමනය නුදුරු කාලීනව තරමක් ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මතුපිට උද්ධමනය යථා තත්ත්වයට පත්වීමට සහාය වෙමින් නිතර මිල උච්චාවචන සහිත ආහාර උද්ධමනය ඉන් පසුව යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### *උද්ධමන අපේක්ෂාවන්*

මහ බැංකුවේ උද්ධමන අපේක්ෂා සමීක්ෂණයට අනුව, වාර්තා වූ උද්ධමන ප්‍රවණතාවයට අනුකූලව 2024 වසරේ ජූනි මස සමීක්ෂණ වාරය තුළ දී සියලු කාලසීමාවන් සඳහා ආයතනික අංශයේ උද්ධමන අපේක්ෂාවන් පෙර මාසයට සාපේක්ෂව පහත වැටී ඇත. 2024 වසරේ ජූනි මස සමීක්ෂණ වාරයට අනුව, වත්මන් මාසයේ සිට මාස 6ක ඉදිරි කාලය දක්වා අපේක්ෂිත උද්ධමනයේ ක්‍රමයෙන් වැඩි වීමක් නිරීක්ෂණය කළ හැකි අතර, සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් විසින් පොලී අනුපාතිකවල අපේක්ෂිත අඩුවීම, රජයේ වියදම් ඉහළ යෑමට සහ රුපියල අවප්‍රමාණය වීමට ඇති ඉඩකඩ මෙයට හේතු සාධක ලෙස දක්වා ඇත. මෙම කාල සීමාවන් හා සසඳන විට, දිගු කාලීන සීමාවන් තුළ උද්ධමන අපේක්ෂාවන් වැඩිවීම සාපේක්ෂව අඩු බවක් පෙන්නුම් කෙරුණි. විශේෂයෙන් ම, පාලනය වී ඇති උද්ධමන අපේක්ෂාවන් පිළිබිඹු කරමින්, සමස්තයක් ලෙස දිගු කාලසීමාවන් සඳහා උද්ධමන අපේක්ෂාවන් සියයට 5ක උද්ධමන ඉලක්කය වටා පැවතුණි.

### මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ ඉදිරි දැක්ම

පවතින දර්ශක, සමීක්ෂණ ප්‍රතිඵල සහ කාර්යමණ්ඩල ඇගයීම් මත පදනම්ව, 2024 වසරේ දෙවන කාර්තුවේ දී ආර්ථිකය අඛණ්ඩ වර්ධනයක් වාර්තා කර ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රධාන වශයෙන් කර්මාන්ත හා සේවා අංශවල ක්‍රියාකාරකම්හි ධනාත්මක වර්ධනය මෙයට දායක වී ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ වුවද, 2024 වසරේ මුල් භාගයේ ඉහළ ආර්ථික වර්ධනයට, පසුගිය කාර්තු කිහිපයකදී තිස්සේ දක්නට ලැබුණු ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩ සංකෝචනය හේතුවෙන් ඇතිවූ 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ අඩු සංඛ්‍යානමය පදනම අර්ධ වශයෙන් දායක වී ඇති බව සැලකිය යුතු කරුණකි. 2023 වසරේ දෙවන භාගයේ වාර්තා වූ ධනාත්මක ආර්ථික වර්ධන හේතුවෙන් ඇති වී තිබෙන ඉහළ සංඛ්‍යානමය පදනම නිසා 2024 වසරේ දෙවන භාගය තුළ ආර්ථික වර්ධනය 2024 වසරේ පළමු භාගයේ වර්ධනයට වඩා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**04 රූප සටහන: කාර්තුමය මූර්ත ද.දේ.නි.යේ වර්ධනයෙහි පුරෝකථන (වාර්ෂික ලක්ෂ්‍යමය, %)**

***2024 වසරේ ජූලි මස පැවති මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව***




මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

ඉහත රූප සටහන **01** හි පැහැදිලි කිරීමේ සටහන බලන්න.

ආයෝජන ප්‍රවර්ධනය කිරීම, පාරිභෝගික වියදම් ඉහළ නැංවීම සහ අවසානයේ සමස්ත ඉල්ලුම ඉහළ නැංවීම මගින් ආර්ථික වර්ධනය එහි විභව මට්ටම කරා ගෙන ඒමට මුදල් තත්ත්වයන් ලිහිල් කිරීම උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ආර්ථික තත්ත්වයන්ගේ අපේක්ෂිත ශක්තිමත් වීම හරහා අපනයන වැඩි වීම තුළින් දේශීය ආර්ථිකයට ප්‍රතිලාභයක් ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වේ. මීට අමතරව, දේශීය සේවා, විශේෂයෙන් සංචාරක කර්මාන්තය ආශ්‍රිත දේශීය සේවා සඳහා බාහිර ඉල්ලුම ශක්තිමත්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. සෘණාත්මක නිමැවුම් පරතරය අඩු කරමින් ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට මෙම තත්ත්ව සහාය වනු ඇතැයි අපේක්ෂිතය. කෙසේ වෙතත්, අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න හේතුවෙන්, ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමට රාජ්‍ය මූල්‍ය අංශයට ඇති හැකියාව සීමිතව පවතී. ඒ අනුව, තිරසාර පදනමක් මත සෘණාත්මක නිමැවුම් පරතරය අඩු කිරීම අභියෝගාත්මක වේ.

දේශීය හා විදේශීය දෙඅංශයේ ම ඉතුරුම්වල සහායයෙන් සිදුවන ආයෝජන ක්‍රියාකාරකම්හි තිරසාර වර්ධනයක්, තිරසාර ලෙස ආර්ථික වර්ධන වේගය පවත්වා ගැනීම සඳහා තීරණාත්මක වනු ඇත. එබැවින්, මැදි කාලීනව ආර්ථිකයට එහි විභව මට්ටම වෙත ළඟා වීම සඳහා, ඵලදායී ප්‍රතිපත්ති සහ සැලසුම් සහගත ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වේ. මේ අනුව, ආර්ථිකයේ ඵලදායීතාව, කාර්යක්ෂමතාව හා තරගකාරීත්වය වැඩිදියුණු කිරීම සහ ව්‍යාපාර පවත්වාගෙන යෑම සඳහා පවතින අහිතකර පරිසරය වැනි ව්‍යුහාත්මක දුර්වලතා අවම කිරීම තුළින් ආර්ථික වර්ධනයට ඇති බාධා අවම කිරීම තිරසාර වර්ධනයක් ළඟා කර ගැනීම සහ ආර්ථිකයේ විභවය වැඩි දියුණු කිරීම සඳහා ඉතා වැදගත් වේ.

## 2.2 පුරෝකථන සඳහා පාදක වන ප්‍රධාන උපකල්පන

මැදි කාලීන පුරෝකථන සඳහා භාවිතා කරන ප්‍රධාන උපකල්පනවල සාරාංශයක් මෙම කොටසේ දක්වා ඇත.

### ගෝලීය පරිසරය

Global Projections Model Network (GPMN)හි[6] පුරෝකථනයන්ට අනුව, 2024 වසරේ දී ගෝලීය ආර්ථිකය සියයට 2.9ක වර්ධන වේගයක් අත්කර ගනු ඇතැයි අපේක්ෂා කරන අතර, ලොව පුරා රටවල පවතින දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් 2025 වසරේ දී සුළු වශයෙන් එහි මන්දගාමීත්වයක් අපේක්ෂා කෙරේ. චීනය හැර අනෙකුත් සියලුම ප්‍රධාන ආර්ථිකයන්හි උද්ධමනය ඉලක්ක අභිබවා පවතී. එක්සත් ජනපදය, එක්සත් රාජධානිය හා යුරෝ කලාපීය ආර්ථිකයන්හි අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම ප්‍රධාන වශයෙන් හේතුවෙමින්, මෙම පුරෝකථන මත පදනම්ව ලබාගත් අපනයන අනුව බර තබන ලද විදේශීය නිමැවුම් පරතරය,[7] පුරෝකථන කාල පරාසය තුළ බොහෝ දුරට ධනාත්මකව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. GPMN පුරෝකථනවලට අනුව, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී මුදල් ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉල්ලුම සම්බන්ධයෙන් සුබවාදී ඉදිරි දැක්මක් මධ්‍යයේ, භූ -දේශපාලනික අර්බුද හා ගෝලීය සැපයුමට බලපාන ඔපෙක් සැපයුම් කප්පාදුව හේතුවෙන් පසුගිය වසරට සාපේක්ෂව 2024 වසරේ දී බ්‍රෙන්ට් බොරතෙල් මිලෙහි සාමාන්‍ය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මැදි කාලීනව ගෝලීය ඛනිජතෙල් මිල ක්‍රමයෙන් ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. මේ අතර, ගෝලීය ආහාර මිල ගණන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර දේශගුණය හා සම්බන්ධ අවදානම් ආහාර සැපයුමට බලපාන බැවින් එම මිල ගණන් වැඩිවීම අඛණ්ඩව සිදුවනු ඇතැයි පුරෝකථනය කෙරේ.

### රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන්මග

ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීමේ ප්‍රයත්නයන්ට අනුකූලව, ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය මෙන්ම දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග, මූලික පුරෝකථන සඳහා යොදා ගන්නා රාජ්‍ය මූල්‍ය ශේෂයන් තුළින් පිළිබිඹු වේ. 2024 වසරේ සිට දත්ත, ජා.මූ. අරමුදලේ 2024 වසරේ ජූනි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද මාණ්ඩලික වාර්තාවේ සඳහන් නවතම පුරෝකථනවලට අනුකූල වේ. බැංකු නැවත ප්‍රාග්ධනීකරණය සඳහා වන අයවැය ප්‍රතිපාදන ආර්ථික වර්ධනය කෙරෙහි බලපෑමක් ඇති නොකරනු ඇතැයි සලකනු ලබන අතර, අයවැය හිඟයේ ගමන් පථය සහ ණය පිරිවැයට අනුකූලව, රජයේ ණය කාර්තුමය පුරෝකථන ආකෘතිය මගින් නිර්ණය කිරීමට ඉඩ දී ඇත.

[6] මහ බැංකුව මැදි කාලීන පුරෝකථන සිදු කිරීම සඳහා GPMN විසින් සකස් කරන ලද ගෝලීය සාර්ව ආර්ථික දර්ශකවල පුරෝකථන භාවිතා කරයි. 2024 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී භාවිතා කරන ලද පුරෝකථන පදනම් වී ඇත්තේ 2024 ජුනි 26 වන දින ලද GPMN විසින් නිකුත් කළ පුරෝකථන මතය.

[7] ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් හය දෙනෙකුට අනුරූප වන සමස්ත අපනයනයේ ප්‍රමතකරණය කරන ලද අනුපාත භාවිතා කර GPMN පුරෝකථනයන්හි සපයා ඇති වෙළෙඳ හවුල්කරුවන්ගේ නිමැවුම් පරතරවල බරිත සාමාන්‍ය නිමැවුම් පරතරයක් ලෙස අපනයනය අනුව බර තබන ලද විදේශ නිමැවුම් පරතරය ගණනය කෙරේ. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ හා සේවා සඳහා වන බාහිර ඉල්ලුම වඩාත් හොඳින් ග්‍රහණය කර ගැනීම සඳහා විදේශීය නිමැවුම් පරතරය සඳහා වන බර තබන ක්‍රමවේදය සමස්ත වෙළෙඳාමේ අනුපාතවල සිට අපනයන අනුපාත දක්වා වෙනස් කර ඇත.

**01 සංඛ්‍යා සටහන: රාජ්‍ය මූල්‍ය ශේෂයන් පිළිබඳ උපකල්පන (ද.දේ.නි.යෙහි % ලෙස)**

| | 2024 | 2025 | 2026 | 2027 | 2028 |
|---|---|---|---|---|---|
| අයවැය හිඟය | 8.6 | 5.2 | 4.6 | 4.1 | 3.8 |
| ණය පිරිවැය | 8.4 | 7.5 | 6.9 | 6.4 | 6.2 |

මූලාශ්‍රය: ජා.මූ. අරමුදලේ 2024 වසරේ ජූනි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද මාණ්ඩලික වාර්තාවේ සඳහන් නවතම පුරෝකථන

### විදේශීය ජංගම ගිණුම

වෙළෙඳ ගිණුම් හිඟය සහ ප්‍රාථමික ආදායම් ගිණුම් හිඟය පුළුල් වීම මධ්‍යයේ පවා, සේවා අපනයන සහ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ආකාරයෙන් ලද සැලකිය යුතු ගලා ඒම් හේතුවෙන් ජංගම ගිණුම 2024 වසරේ පළමු කාර්තුවේ දී අතිරික්තයක් වාර්තා කළේය. ආනයන සීමා ලිහිල් කිරීමත් සමඟ ඉදිරියේ දී ආනයන ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආනයන වියදම් ඉහළ යෑම හේතුවෙන් 2024 වසරේ අග භාගයේ දී වෙළෙඳ හිඟය පුළුල් වනු ඇතැයි අපේක්ෂා කළ ද, සේවා ගිණුමේ සහ ද්විතීයික ආදායමේ අපේක්ෂිත වැඩි දියුණු වීම් විදේශීය අංශයේ ධනාත්මක වර්ධනයේ අඛණ්ඩ පැවැත්මට දායක වනු ඇත. එබැවින් විදේශීය ජංගම ගිණුමේ සුළු අතිරික්තයක් 2024 වසරේ දී ද අපේක්ෂා කෙරේ.

## 2.3 පුරෝකථන මත පවතින අවදානම්

උද්ධමනය සහ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය යන ද්විත්වය ම, පුරෝකථනය කරන ලද මට්ටම්වලට වඩා ඉහළ යෑම සඳහා මෙන්ම පහළ යෑම සඳහා ද අවදානම් පවතී. 2024 වසරේ ජූලි මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයට අනුව, එවැනි අවදානම් පිළිබඳ විවරණයක් මෙම කොටසේ දක්වා ඇත.

### උද්ධමන පුරෝකථන මත පවතින අවදානම්

උද්ධමන පුරෝකථන හා සම්බන්ධ පහළ යෑමේ අවදානම් සැලකුවිට, මහජනතාවගේ මිල දී ගැනීමේ ශක්තිය හීන වීමේ දිගු කාලීන බලපෑම පාරිභෝගික වියදම් අඛණ්ඩව අඩු වීමට හේතු විය හැකි අතර, එමගින් ඉල්ලුම් තත්ත්වය පහළ යෑම සඳහා පීඩනයක් ඇති වේ. මැදි කාලීනව භූ-දේශපාලනික අර්බුද ලිහිල් වීමට ඉඩ ඇති අතර එමගින් ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා සහ ගෝලීය වෙළඳාම සඳහා පවතින අවහිරතා අඩු විය හැකි හෙයින් වෙළඳ භාණ්ඩ සහ අනෙකුත් භාණ්ඩවල මිල ඉහළ යෑමේ පීඩන සමනය විය හැකිය. අඩු බලශක්ති පිරිවැය නිෂ්පාදන හා ප්‍රවාහන වියදම් අඩු කරන බැවින්, අපේක්ෂිත මට්ටම්වලට වඩා විශාල ලෙස බලශක්ති මිල අඩු වීමෙහි වක්‍ර බලපෑම් වෙනත් භාණ්ඩ හා සේවාවල මිල මට්ටම් පොදුවේ සැලකිය යුතු ලෙස අඩු වීමට හේතු විය හැකිය.

පුරෝකථනය කරන ලද මාර්ගයට වඩා උද්ධමනය ඉහළ යෑමට හේතුවන අවදානම් ද ඇතිවිය හැකිය. පසුගිය කාලයේ මිල ගණන් වැඩිවීම එලෙසම පැවතීම හේතුවෙන් භාණ්ඩවල මිල ඉහළ අගයක පැවතීම, අඩු මට්ටමක පවතින ආර්ථික ක්‍රියාකාරකම් සහ දැඩි රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් නිසා මූර්ත ආදායම මත පීඩනයක් ඇතිවීම එක් පසෙකින් ද, අනෙක් පසින් විවිධ අංශවලවල බුද්ධිගලනය හේතුවෙන් ව්‍යාපාරවල කාර්යමණ්ඩලය රඳවාගැනීමේ ක්‍රියාමාර්ග අවශ්‍ය වීම යනාදී කරුණු නිසා ඉහළ වැටුප් සඳහා වන ඉල්ලුම් සාක්ෂාත් වීමේ

හැකියාවක් තිබේ. ව්‍යාපාර විසින් එලෙස වැඩිවන පිරිවැය පාරිභෝගිකයන් මත පැවරීමත් සමඟ තවදුරටත් මිල ඉහළ යෑම් සිදුවිය හැකිය. අයහපත් කාලගුණික තත්ත්වයන් කෘෂිකාර්මික නිෂ්පාදනයට අහිතකර ලෙස බලපෑ හැකි අතර එමගින් ආහාර උද්ධමනය ඉහළ යෑමට හැකිය. විනිමය අනුපාතිකය මත විය හැකි යම් අවප්‍රමාණය වීමේ පීඩන හේතුවෙන් ද උද්ධමනය ඉහළ යෑමේ අවදානම් මතු විය හැකිය. තවද, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාර්ගයෙන් යම් අපගමනයක් සිදු වීමෙන්, රාජ්‍ය වියදම් වැඩි වීම (හෝ වියදම් සීමා කිරීම අපේක්ෂිත මට්ටමට වඩා අඩු මට්ටමක පැවතීම) හරහා ද උද්ධමන පීඩනය ඇති විය හැකිය. මීට අමතරව, මෑත කාලීනව ගෝලීය ඛනිජතෙල් මිල යම් අස්ථාවරත්වයකට ලක්ව ඇති අතර, මෑත දී භූ-දේශපාලනික අර්බුද තීව්‍ර වීමේ ප්‍රතිඵලයක් ලෙස එම තත්ත්වය අඛණ්ඩව පැවතිය හැකිය. තවද, විශේෂයෙන් ම නුදුරු කාලීනව, දේශීය ආහාර මිල මට්ටම් ඉහළ නැංවීමට හේතුවන ගෝලීය ආහාර මිල ඉහළ යෑමේ අවදානම් පවතී.

උග්‍ර වූ භූ-දේශපාලනික අවිනිශ්චිතතාවය සහ ඒ ආශ්‍රිත ගෝලීය මිල මට්ටම් ඉහළ යාමේ හැකියාව මධ්‍යයේ ගෝලීය ඛනිජතෙල් සහ ආහාර මිලෙහි ඉහළ අස්ථාවරත්වය, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමට ඇති පීඩනය සහ ආහාර උද්ධමනය මත අයහපත් කාලගුණයෙන් මතුවන බලපෑම සැලකිල්ලට ගනිමින්, නුදුරු කාලීනව උද්ධමන පුරෝකථන සම්බන්ධයෙන් ඇති අවදානම් සමස්තයක් ලෙස ඉහළ යෑමක් තක්සේරු කර ඇත. කෙසේ වෙතත්, මැදි කාලීනව, උද්ධමන පුරෝකථන සඳහා වන අවදානම් තුලිතව පවතින අතර, එහි දී උද්ධමනය ඉහළ යෑමේ සහ පහළ යෑමේ අවදානම් යන ද්විත්වය ම මගින් මිල මට්ටම් මත පීඩන ඇති කෙරෙනු ඇතැයි අපේක්ෂිතය.

## ආර්ථික වර්ධන පුරෝකථන මත පවතින අවදානම්

නුදුරු කාලයේ සිට මැදි කාලය දක්වා ඇති ආර්ථික වර්ධන පුරෝකථන සම්බන්ධයෙන් ඇති පහළ යෑමේ ප්‍රධාන අවදානම් ලෙස, ශ්‍රම හිඟය සහ අඩු ඵලදායීතාවයට හේතුවන බුද්ධි ගලනය; ව්‍යාපාරික අපේක්ෂා සහ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ හැකි දේශපාලන අවිනිශ්චිතතා; ප්‍රධාන අපනයන සඳහා ගෝලීය ඉල්ලුම අඛණ්ඩව අඩු මට්ටමක පැවතීම, විශේෂයෙන් ම විශාල ආර්ථිකයන් අතර වෙළඳ සබඳතාවල ගැටලු හා දේශීය ආර්ථිකයට එමගින් ඇති වන බලපෑම; භූ-දේශපාලනික අර්බුද වැඩි වීම; සහ කාලගුණික විපර්යාස හා දේශගුණික වෙනස්වීම් මගින් ආර්ථික ක්‍රියාකාරකම්වලට සිදුවන අහිතකර බලපෑම යනාදිය සැලකිය හැකිය.

ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ අපේක්ෂා කරන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල ප්‍රගතිය සමස්ත සාර්ව ආර්ථික ස්ථායීතාවයට සහ වර්ධනයට බලපාන ප්‍රධාන සාධකයක් වේ. මෙම මාර්ගයෙන් ඉවතට සිදුවන ඕනෑම සැලකිය යුතු අපගමනය වීමක් සහ ප්‍රතිපත්ති නැවත වෙනස් කිරීමක් හේතුවෙන් ආර්ථික වර්ධනය අඩාල වීම, විශ්වාසය පළුදු වීම සහ ඍණාත්මක ආයෝජක අපේක්ෂා අඛණ්ඩව පැවතීම හේතුවෙන් රටට ඉහළ ආර්ථික පිරිවැයක් ඇති විය හැකිය.

ආනයන සීමා ඉවත් කිරීමත් සමඟ ආනයන මත යැපෙන ව්‍යාපාර යථා තත්ත්වයට පත්වීමට ඇති හැකියාව නිසා ආර්ථික වර්ධනය පුරෝකථනවලට වඩා ඉහළ යෑමේ අවදානමක් ඇත. විශාල යටිතල පහසුකම් සංවර්ධන ආශ්‍රිත ක්‍රියාකාරකම්වල වර්ධනය වැඩිදියුණු වීම සමස්ත ආර්ථික කාර්යසාධනය වැඩිදියුණු කිරීමට දායක විය හැකිය. සංචාරක ව්‍යාපාරය අපේක්ෂිත මට්ටම්වලට වඩා වේගවත්ව යථා තත්ත්වයට පත්වීමෙන් අදාළ අංශවල වර්ධනයක් ඇති වීම, රැකියා අවස්ථා වැඩි වීම සහ පාරිභෝගික වියදම් ඉහළ යෑම හේතුවෙන් ආර්ථික වර්ධනය වැඩි දියුණු විය හැකි ධනාත්මක වක්‍ර බලපෑම් ඇති කළ හැකිය. තෝරාගත් රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගතකරණ

ක්‍රියාවලිය හරහා ඇතිවන ධනාත්මක වක්‍ර බලපෑම් සහ සාර්ථක ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් ඇති විය හැකි හිතකර වර්ධනයන් ආර්ථික වර්ධන වේගයට ධනාත්මක ලෙස බලපෑ හැකිය.

පුරෝකථනය සම්බන්ධයෙන් පවතින අවදානම්වල සමස්ත දිශානතිය සැලකූවිට, ආර්ථික වර්ධන පුරෝකථන සඳහා ඇති අවදානම නුදුරු කාලීනව මෙන්ම මැදි කාලීනව තුලිතව පවතිනු ඇතැයි තක්සේරු කර ඇත. ආර්ථික වර්ධන පුරෝකථන සම්බන්ධයෙන් ඉහළ යෑම සඳහා ඇති අවදානම්වල බලපෑම, ආර්ථික වර්ධන පුරෝකථන සම්බන්ධයෙන් පහළ යෑම සඳහා ඇති අවදානම්වල බලපෑම මගින් අහෝසි වීම මෙවැනි තක්සේරුවක් කිරීමට හේතු විය. පසුගිය මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ (2024 වසරේ පෙබරවාරි මස මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ) ඉදිරිපත් කරන ලද පුරෝකථන හා සසඳන විට, 2024 වසරේ ජූලි මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයේ දී ආර්ථික වර්ධනය පුරෝකථන සම්බන්ධයෙන් ඇති ඉහළ යෑමේ අවදානම් ඉහළ මට්ටමක පවතින බවට තක්සේරු කර ඇති අතර, එමගින් අවදානම් තුලිතව පවතින ලෙස අවදානම් තක්සේරු කිරීම ඉහළ නංවා ඇත.

**05 රූප සටහන: පුරෝකථන මත ඇතිවන අවදානම්වල සමස්ත දිශානතිය**




මූලය: මහ බැංකු කාර්ය මණ්ඩල පුරෝකථන

**06 රූප සටහන: ගෝලීය පුරෝකථන (කාර්තුමය)**




මූලයන්:කාර්තුමය පුරෝකථන ආකෘතිය, Global Projection Model Network (GPMN)
(2024.01.05 සහ 2024.06.26 යාවත්කාලීන කිරීම්)

## 2.4 පෙර පුරෝකථන සමඟ සැසඳීම[8]

### මැදි කාලීන පුරෝකථන සඳහා භාවිතා කළ ප්‍රධාන උපකල්පන

2024 වසරේ ජූලි මාසයේ පැවති මුදල් ප්‍රතිපත්ති වාරයේ දී භාවිතා කරන ලද ගෝලීය පුරෝකථන ගත්කළ, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ අපනයන අනුව බර තබන ලද විදේශ නිමැවුම් පරතරය පිළිබඳ ඉදිරි දැක්ම 2024 වසරේ ජනවාරි මාසයේ පැවැති තොරතුරු හා සසඳන විට වැඩිදියුණු වී ඇත. එක්සත් ජනපදය, යුරෝ කලාපය, සහ එක්සත් රාජධානිය යනා දී ආර්ථිකවල ආර්ථික ක්‍රියාකාරකම් සම්බන්ධ පුරෝකථන වැඩිදියුණු වීම මෙයට ප්‍රධාන වශයෙන් දායක විය. 2024 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී භාවිතා කරන ලද ගෝලීය පුරෝකථන මගින් ඉදිරිපත් වූ ආහාර උද්ධමනය 2024 වසරේ ජනවාරි මුදල් ප්‍රතිපත්ති වාරයට සාපේක්ෂව මන්දගාමී වැඩිවීමක් පුරෝකථනය කරයි. දැනට සෘණාත්මකව පවතී යැයි ඇස්තමේන්තු කර ඇති ගෝලීය ආහාර

---

[8] මෙම කොටස මගින් 2024 වසරේ ජනවාරි මස ප්‍රතිපත්ති විවරණයේදී පැවැති තොරතුරු සහ පුරෝකථන මත පදනම් වූ, 2024 වසරේ පෙබරවාරි මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ඉදිරිපත් කරන ලද මූලික පුරෝකථනයට සාපේක්ෂව වත්මන් මූලික පුරෝකථනය සංසන්දනය කෙරේ.

උද්ධමනය 2024 වසරේ සිව්වන කාර්තුවේ දී ධනාත්මක බවට පත් වී ඉන් පසුව ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2024 වසරේ ජනවාරි මාසයේ පුරෝකථනය කළ මට්ටම්වලට සාපේක්ෂව ගෝලීය බනිජතෙල් මිල 2024 වසරේ දෙවන කාර්තුව තුළ ඉහළ මට්ටමක පැවැතිණි. මෙම ප්‍රවණතාවය කෙටි කාලීනව අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය පෙර අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා තරමක් ඉහළ පුරෝකථන මාර්ගයකට හේතුවේ. මේ අතර, ෆෙඩරල් සංචිත බැංකුවේ පරික්ෂාකාරී හැසිරීම මධ්‍යයේ, එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම පෙර පුරෝකථනවලට සාපේක්ෂව මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන්මග සඳහා වන වත්මන් පුරෝකථන 2024 ජනවාරි වාරයට සාපේක්ෂව යාවත්කාලීන වී ඇති අතර, එම සංශෝධන ප්‍රධාන වශයෙන් 2024 වර්ෂය සඳහා සිදුවී ඇත. 2024 වසර සඳහා වන රාජ්‍ය මූල්‍ය ශේෂය, රාජ්‍ය ආදායමේ අපේක්ෂිත වැඩිවීම් හේතුවෙන් පෙර පුරෝකථනවලට සාපේක්ෂව වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ ශේෂය පිළිබඳ උපකල්පන නව තොරතුරු පිළිබිඹු කිරීම සඳහා යාවත්කාලීන කර ඇත. ඒ අනුව, වසරේ අවසාන කාලයේ දී ආනයන ඉහළ යෑම මූලිකව හේතු කරගෙන 2024 වසර සඳහා ජංගම ගිණුමේ අතිරික්තය 2024 වසරේ ජනවාරි මාසයේ දී උපකල්පනය කළ මට්ටමට වඩා අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

## උද්ධමනයේ හැසිරීම

2024 වසරේ පෙබරවාරි මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ප්‍රකාශයට පත් කරන ලද පුරෝකථන හා සසඳන විට, 2024 වසරේ පළමු සහ දෙවෙනි කාර්තු දෙකෙහි දී ම වාර්තා වූ වාර්ෂික ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය පුරෝකථනය කළ මට්ටමට වඩා පහළ මට්ටමක පැවති අතර, ඒ සඳහා එකතු කළ අගය මත බදු සංශෝධනයෙන් උද්ධමනයට වූ බලපෑම අපේක්ෂිත මට්ටමට වඩා අඩු වීම සහ විදුලි ගාස්තු සැලකිය යුතු ලෙස අඩු කිරීම ප්‍රධාන වශයෙන් හේතු විය. 2024 වසරේ ජනවාරි මාසයේ බදු ඉහළ දැමීම හේතුවෙන් ඇතිවන උද්ධමනයේ බලපෑම 2024 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ උද්ධමන පුරෝකථනවලට ඇතුළත් විය. කෙසේ වෙතත්, එවැනි බදු වැඩිකිරීම්වලින් ඇතිවූ බලපෑම මුලින් අපේක්ෂා කළ තරම් විශාල නොවූ අතර, කාර්යමණ්ඩල විනිශ්චයන්හි දී සලකා බැලූ ඇතැම් එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කිරීම ක්‍රියාත්මක නොවීය. ඉල්ලුම් තත්ත්වයන් දිගින් දිගට ම දුර්වල මට්ටමක පැවතීම හමුවේ බදු අනුපාත වෙනස්කිරීමෙන් පසුව සැලකිය යුතු ලෙස මිල වැඩි කිරීමට ව්‍යාපාර මැලි වීම හේතුවෙන් එකතු කළ අගය මත බදු වැඩි කිරීමේ සමස්ත බලපෑම උද්ධමනය සඳහා සම්පූර්ණයෙන් දායක නොවීය. මේ අතර, 2024 වසරේ මාර්තු මාසයේ දී සිදුකළ විදුලි ගාස්තු අඩු කිරීම, 2024 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථනවල දී අපේක්ෂා කළ සංශෝධනයට වඩා සැලකිය යුතු ලෙස වැඩි විය. එපමණක් නොව, 2024 වසරේ ජූලි මාසයේ දී සිදු කරන ලද විදුලි ගාස්තු අඩු කිරීම පිළිබඳ තොරතුරු ද 2024 ජනවාරි මුදල් ප්‍රතිපත්ති වාරයේ දී නොතිබූ අතර, එබැවින් 2024 වසරේ තුන්වන කාර්තුව සඳහා පුරෝකථනය කළ උද්ධමනය ද පෙර ගමන් මාර්ගයට වඩා වෙනස් වේ. අහිතකර පදනම් බලපෑම හේතුවෙන් 2024 වසරේ තුන්වන කාර්තුවේ දී උද්ධමනය තාවකාලිකව ඉහළ යා හැකි බව පෙර පුරෝකථනයන් පෙන්වා දුන්නේය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් විදුලි ගාස්තු විශාල ලෙස අඩු කිරීම හේතුවෙන් 2024 වසරේ තුන්වන කාර්තුවේ දී ඇතිවන කාර්තුමය ලක්ෂ්‍යාමය පදනම මත ඇති වන නිර්-උද්ධමනකාරී බලපෑම අහිතකර සංඛ්‍යාන පදනම් බලපෑමට වඩා වැඩි වනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඒ හේතුවෙන් 2024 වසරේ තුන්වන කාර්තුව සඳහා පුරෝකථනය කළ වාර්ෂික ලක්ෂ්‍යාමය උද්ධමනය අඩු අගයක් ගනු ඇත. මීට අමතරව, ඉන්ධන සහ LP ගෑස් මිල වරින් වර අඩු කිරීම මෙන්ම නිරන්තර මිල වෙනස්වීම් පිළිබිඹු කරන ආහාර ද්‍රව්‍යවල මිලෙහි යම් අඩුවීමක් ද උද්ධමනය කලින් පුරෝකථනය කළ මාර්ගයෙන් බැහැරවීමට හේතුවිය. 2024 වසරේ පළමු කාර්තුවේ දී එකතු කළ අගය මත බදු හේතුවෙන් ඇති වූ සංඛ්‍යාන පදනම් බලපෑම හේතුවෙන් 2025 වසරේ මුල්

කාලයේ දී උද්ධමනය මන්දගාමී වනු ඇති බවට කලින් සිදු කළ පුරෝකථනය වත්මන් පුරෝකථනවල ද අඩංගු වේ. කෙසේ වෙතත්, 2024 වසරේ ජනවාරි පුරෝකථන මෙන් නොව, මෑතක දී විදුලි ගාස්තු අඩු කිරීම හේතුවෙන් ඇතිවන අහිතකර සංඛ්‍යාන පදනම් බලපෑම 2025 වසරේ තුන්වන කාර්තුවේ දී වාර්ෂික ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය ඉලක්කගත මට්ටමට වඩා තාවකාලිකව ඉහළ යෑම සඳහා හේතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ වුවද, පෙර පුරෝකථනවලට සමානව, උද්ධමනය මැදි කාලීනව උද්ධමන ඉලක්කය වටා ක්‍රමයෙන් ස්ථායී වනු ඇතැයි අපේක්ෂිතය.

# 3. වර්තමාන ආර්ථික තත්ත්වය

## 3.1 උද්ධමනය

***එකතු කළ අගය මත බදු ඉහළ දැමීම හේතුවෙන් 2024 වසරේ මුල් කාලයේදී තාවකාලිකව ඉහළ ගිය මතුපිට උද්ධමනය, ඉල්ලුම් පීඩන පහළ වැටීම මධ්‍යයේ ආහාර, ඉන්ධන සහ එල්.පී.ගෑස් මිල ගණන් පහළ යෑම මෙන්ම විදුලිය ගාස්තු අඩු කිරීමේ සංශෝධන හේතුවෙන් අඩුවූ අතර, ඉන් අනතුරුව සියයට 5ක් වන උද්ධමන ඉලක්කයට සැලකිය යුතු ලෙස පහළින් අඛණ්ඩව පැවතිණි.***

**07 රූප සටහන: මතුපිට සහ මූලික උද්ධමනයේ හැසිරීම (කො.පා.මි.ද., 2021=100)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සැපයුම් අංශයේ සාධක හේතුවෙන් 2023 වසරේ අවසාන කාලය වන විට ඉහළ ගිය කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100) පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, එකතු කළ අගය මත බදු අනුපාතික ඉහළ දැමීම සහ ඇතැම් එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කිරීම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන 2024 ජනවාරි මාසයේදී සියයට 6.4ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2024 මාර්තු මාසයේ දී විදුලිය ගාස්තු සැලකිය යුතු ලෙස අඩු කරමින් සිදුකළ ගාස්තු සංශෝධන ක්‍රියාත්මක කිරීමත් සමඟ, මතුපිට උද්ධමනය සැලකිය යුතු ලෙස පහළ ගියේය. තවද, අඩු ඉල්ලුම් තත්ත්ව මධ්‍යයේ, උද්ධමනය කෙරෙහි එකතු කළ අගය මත බදු සංශෝධනවල ඍජු හා දෙවන වටයේ බලපෑම පෙර අපේක්ෂා කළ පරිදි සැලකිය යුතු මට්ටමක නොවීය. මතුපිට උද්ධමනය අඩු වීම සඳහා ආහාර මිල ගණන් පහළ යෑමද හේතු විය. මීට අමතරව, ගෘහස්ත ඉන්ධන සහ එල්.පී.ගෑස් මිල ගණන් අවස්ථා කිහිපයකදීම පහළ දමමින් සිදුකළ මිල සංශෝධනද උද්ධමනය අඛණ්ඩව අඩුවීමට දායක විය. ඒ අනුව, කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2024 ජූනි මාසය වන විට සියයට 1.7ක් ලෙස වාර්තා විය.[9] 2024 ජූනි මාසයේදී කො.පා.මි.ද. පදනම් කරගත් ආහාර සහ ආහාර නොවන කාණ්ඩවල උද්ධමනය පහළ අගයක පැවතිණි. මෙම වර්ධනයන් සමඟ, කො.පා.මි.ද. පදනම් කරගත් මතුපිට උද්ධමනයේ කාර්තුමය සාමාන්‍යය පෙර කාර්තුවේ පැවති සියයට 4.4 සිට 2024 දෙවැනි කාර්තුවේදී සියයට 1.4ක් දක්වා අඩුවිය. ඒ අනුව, 2024 වසරේ දෙවැනි කාර්තුව තුළ වාර්තා වූ

[9] 2024 ජූලි මාසයේදී කො.පා.මි. දර්ශකය මත පදනම් මතුපිට උද්ධමනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 2.4ක් විය.

මතුපිට උද්ධමනයේ කාර්තුමය සාමාන්‍යය, ඉලක්කගත උද්ධමනයට වඩා පහළ මට්ටමක පැවති අතර එය මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමේ සඳහන් ප්‍රතිශතාංක 2.0 ක ආන්තිකයට වඩා වැඩි අගයක් විය. මේ අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2021=100) මත පදනම් මතුපිට උද්ධමනය ද, 2024 ජනවාරි මාසයේ වූ සියයට 6.5 (වාර්ෂික ලක්ෂ්‍යමය) සිට 2024 ජූනි මාසයේදී සියයට 2.4 දක්වා පහළ ගියේය.

**08 රූප සටහන: මාසික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (කො.පා.මි.ද.) සඳහා දායකත්වය**




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මහ බැංකු කාර්ය මණ්ඩල ගණනය කිරීම්

**09 රූප සටහන: කාණ්ඩ අනුව වර්ගීකරණය කරන ලද වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (කො.පා.මි. ද.,%)**




සටහන: පදනම් බරිත අගයන් වරහන් තුළ දක්වා ඇත.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**10 රූප සටහන: වාර්ෂික ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කො.පා.මි.ද.)**




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මහ බැංකු කාර්ය මණ්ඩල ගණනය කිරීම්

ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිඹිබු කරන, කො.පා.මි.ද. මත පදනම් මූලික උද්ධමනය 2024 ප්‍රථම භාගය තුළදී ක්‍රමයෙන් ඉහළ ගිය අතර, 2024 ජූනි මාසයේදී සියයට 4.4ක වාර්ෂික ලක්ෂ්‍යාමය උද්ධමනයක් වාර්තා කළේය.[10] අහිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම සමග එකතු කළ අගය මත බදු ව්‍යුහයේ වෙනස් වීම් ද මේ සඳහා දායක විය. මේ අතර, ජා.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යාමය මූලික උද්ධමනය 2024 ජූනි මාසයේදී සියයට 3.9ක් ලෙස වාර්තා විය.

***2024 වසරේ පළමු භාගයේ දී, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100) සහ රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) යන ද්විත්වයම ඉහළ යෑමක් වාර්තා කළේය.***

2023 වසරේ දී නාමික වැටුප්හි දක්නට ලද ඉහළ යෑමේ ප්‍රවණතාව තවදුරටත් පවත්වා ගනිමින්, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100), 2024 වසරේ පළමු භාගයේ දී සමස්තයක් ලෙස ඉහළ යෑමක් වාර්තා කරන ලදී. ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වයෙහි ම දක්නට ලැබුණු මෙම ඉහළ යෑම, කෘෂිකාර්මික සහ සේවා ක්‍රියාකාරකම්වල විශේෂයෙන් කැපී පෙනුණි. කෙසේ වුවද, පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව 2024 වසරේ පළමු භාගයේ දී උද්ධමන පීඩනය ලිහිල් වීමත් සමග, වාර්ෂික ලක්ෂ්‍යාමය පදනම මත මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ (2018=100) වර්ධනය මන්දගාමී විය. තවද, උද්ධමනය අඛණ්ඩව අඩුවීමත් සමඟ පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යාමය වර්ධනය තවදුරටත් වේගවත් විය.

2024 වසරේ ජනවාරි සහ අප්‍රේල් මාසවල දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ ජීවන වියදම් දීමනාව ඉහළ දැමීමත් සමග, 2024 වසරේ පළමු භාගයේ දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) ඉහළ ගියේය. මේ අතර, උද්ධමනය මන්දගාමී වීම හේතුවෙන් මූර්ත වැටුප් පහළ යෑම පාලනය වී ඇත.

[10] 2024 ජූලි මාසයේදී කො.පා.මි. දර්ශකය මත පදනම් මූලික උද්ධමනය, වාර්ෂික ලක්ෂ්‍යාමය පදනම මත සියයට 4.4ක් විය.

11 රූප සටහන: අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ (2018=100) සහ රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ (2016=100) වෙනස්වීම්




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 3.2 මූර්ත අංශය

***ශ්‍රී ලංකා ආර්ථිකය අඛණ්ඩව කාර්තු තුනක් ධනාත්මක වර්ධනයක් වාර්තා කරමින් 2024 වසරේ පළමු කාර්තුවේ දී යහපත් වර්ධන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.***

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ද.දේ.නි. ඇස්තමේන්තුවලට අනුව, ශ්‍රී ලංකා ආර්ථිකය 2023 වසරේ පළමු කාර්තුවේ වාර්තා කළ සියයට 10.7ක පහත වැටීමට සාපේක්ෂව, 2024 වසරේ පළමු කාර්තුවේ දී ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනෙහිම ධනාත්මක දායකත්වයක් සහිතව සියයට 5.3කින් වර්ධනය විය.

මෙම කාලපරිච්ඡේදය තුළ ධීවර කටයුතු, සත්ත්ව නිෂ්පාදන සහ ධාන්‍ය වගා කටයුතුවල වර්ධනය හේතුවෙන් කෘෂිකාර්මික කටයුතුවල වර්ධනයක් වාර්තා විය. නිෂ්පාදන, ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතු සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම්වල කැපී පෙනෙන වර්ධනයක් සිදු විය. නවාතැන්, ප්‍රවාහන, තොග සහ සිල්ලර වෙළඳාම, දේපළ වෙළඳාම් සහ රක්ෂණ සේවා යන අංශවල ධනාත්මක කාර්යසාධනය ප්‍රධාන වශයෙන් සේවා ක්‍රියාකාරකම්වල වර්ධනය සඳහා දායක විය.

02 සංඛ්‍යා සටහන: මූර්ත ද.දේ.නි. වර්ධන ඇස්තමේන්තු (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, %) (තාවකාලික)

| ආර්ථික කටයුතු | 2023 | | | | | 2024 |
|---|---|---|---|---|---|---|
| | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | පළමු කාර්තුව |
| කෘෂිකර්මාන්තය | 1.6 | 4.2 | 4.2 | 0.6 | 2.6 | 1.1 |
| කර්මාන්ත | -24.3 | -11.7 | -0.7 | 7.9 | -9.2 | 11.8 |
| සේවා | -4.6 | -0.5 | 1.7 | 2.8 | -0.2 | 2.6 |
| **ද.දේ.නි.** | **-10.7** | **-3.0** | **1.6** | **4.5** | **-2.3** | **5.3** |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඉදිරි ආර්ථික දර්ශක මගින් පෙන්වා දෙන පරිදි, ප්‍රධාන වශයෙන් කර්මාන්ත හා සේවා ක්‍රියාකාරකම්වල දායකත්වයෙන්, 2024 වසරේ දෙවන කාර්තුව තුළ දී ද ආර්ථිකයෙහි යහපත් වර්ධන ප්‍රවණතාව තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. වසරේ දෙවන කාර්තුව තුළ දී කාර්මික නිෂ්පාදන දර්ශකය ඉහළ ගියේය. නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2024 අප්‍රේල් මාසයේ දී පෙර වසරවල පැවති රටාවට අනුගතව පහත වැටුණද, මැයි සහ ජූනි මාසවල දී නිෂ්පාදන ක්‍රියාකාරකම්වල වර්ධනයන් පිළිබිඹු කරමින් මාසික ලක්ෂ්‍යාමය පදනමින් වර්ධනය විය. තවද, ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ද 2024 අප්‍රේල් මාසයේ දී පෙර වසරවල පැවති රටාවට අනුගතව පහත වැටීමක් වාර්තා කළ ද, ඉදිකිරීම් කටයුතුවල ක්‍රමික වර්ධනයක් පිළිබිඹු කරමින් මැයි සහ ජූනි මාසවල දී ඉහළ ගියේය. මේ අතර, සේවා අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය මගින් පෙන්නුම් කළ පරිදි, 2024 වසරේ දෙවන කාර්තුවේ දී සේවා ක්‍රියාකාරකම්ද වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම සංචාරක පැමිණීම් ඉහළ යෑම හේතුවෙන් නවාතැන්, ආහාරපාන සේවා සහ ප්‍රවාහන කටයුතු වැනි ක්‍රියාකාරකම් කෙරෙහි යහපත් බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂිතය. මේ අතර, අයහපත් කාලගුණික තත්ත්වයන් මධ්‍යයේ කෘෂිකාර්මික කටයුතු මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**12 රූප සටහන: ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල වෙනස් වීම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පවත්නා මිල අනුව වියදම් ප්‍රවේශයේ ඇස්තමේන්තු සලකා බලන විට, ප්‍රධාන වියදම් කාණ්ඩය වන පරිභෝජන වියදම සුළු වර්ධනයක් වාර්තා කරමින් ඉල්ලුමට ධනාත්මකව දායක වූ අතර, ආයෝජන වියදම සැලකිය යුතු ඉහළ යමින් යථා තත්ත්වයට පත්වීම 2024 වසරේ පළමු කාර්තුව තුළ දී සමස්ත ඉල්ලුමෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, 2024 වසරේ පළමු කාර්තුව තුළ දී භාණ්ඩ හා සේවා අපනයන වර්ධනය, භාණ්ඩ හා සේවා ආනයන වර්ධනය අභිබවා යෑම හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුම වර්ධනය විය.

**03 සංඛ්‍යා සටහන: සමස්ත ඉල්ලුම (තාවකාලික)**

| අයිතමය | ස්ථාවර මිල අනුව (2015) | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2023 | | 2023 පළමු කාර්තුව | | 2024 පළමු කාර්තුව | |
| | රුපියල් බිලියන | වාර්ෂික ලක්ෂ්‍යමය, % | රුපියල් බිලියන | වාර්ෂික ලක්ෂ්‍යමය, % | රුපියල් බිලියන | වාර්ෂික ලක්ෂ්‍යමය, % |
| දේශීය ඉල්ලුම | 11,739 | -3.4 | 3,128 | -15.0 | 3,280 | 4.9 |
| පරිභෝජනය | 9,078 | -2.2 | 2,329 | -11.0 | 2,342 | 0.5 |
| ආයෝජනය (දළ ප්‍රාග්ධන සම්පාදනය) | 2,661 | -7.4 | 799 | -25.0 | 939 | 17.6 |
| ශුද්ධ විදේශීය ඉල්ලුම | 142 | 1,462.6 | 34 | 124.4 | 49 | 43.4 |
| + භාණ්ඩ හා සේවා අපනයන | 2,667 | 12.0 | 657 | 8.4 | 779 | 18.6 |
| - භාණ්ඩ හා සේවා ආනයන | 2,524 | 6.5 | 622 | -16.5 | 730 | 17.3 |
| **ද.දේ.නි.** | **11,882** | **-2.3** | **3,162** | **-10.7** | **3,330** | **5.3** |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 3.3 මුදල් අංශය

### පොලී අනුපාතික

***ශ්‍රී ලංකා මහ බැංකුව අනුගමනය කරන ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව වෙළඳපොළ පොලී අනුපාතික 2024 වසරේ මේ දක්වා කාලය තුළදී අඛණ්ඩව අඩු වුවද, වෙළඳපොළ ණය පොලී අනුපාතික තවදුරටත් අඩු වීම සඳහා අවකාශයක් පවතී.***

2023 ජූනි මාසයේ සිට ක්‍රියාත්මක කළ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ක්‍රමයෙන් වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීමත් සමඟ සමස්ත පොලී අනුපාතික ව්‍යුහය අඛණ්ඩව පහළ ගියේය. ලිහිල් මුදල් තත්ත්ව සහ වැඩිදියුණු වූ ද්‍රවශීලතා තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් වෙළඳපොළ තැන්පතු පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වූ අතර, අඩු වූ වෙළඳපොළ ණය පොලී අනුපාතික හේතුවෙන් මූල්‍ය පිරිවැය අඩු වීම හරහා ව්‍යාපාර සහ කුටුම්භ මත වූ මූල්‍ය පීඩන අවම වී ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම, බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය මගින් පිළිබිඹු වන බැංකු විසින් සිය ප්‍රධාන ගනුදෙනුකරුවන්ට ලබාදෙන ණය සඳහා වන පොලී අනුපාතික 2024 ජූලි මස අවසානය වන විට ආර්ථික අර්බුදයට පෙර පැවති අගයන් දක්වා අඩු විය. කෙසේ වෙතත්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මෙන්ම තනි පුද්ගල ණය සඳහා වන පොලී අනුපාතික පහළ යෑම තැන්පතු පොලී අනුපාතික පහළ යෑමට සාපේක්ෂව අඩු මට්ටමක පවතී. බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය මගින් පිළිබිඹු වන නව ණය සහ නව තැන්පතු පොලී අනුපාතික අතර පරතරය 2024 ජූනි මස අවසානය වන විට එහි ඉතිහාසයේ වාර්තා වූ සාමාන්‍යයට සාපේක්ෂව ඉහළ අගයක පැවතුණි. ඉදිරි කාලය තුළදී වෙළඳපොළ ණය පොලී අනුපාතික තවදුරටත් අඩු වීම සඳහා පවතින අවකාශය මෙමගින් පෙන්නුම් කෙරේ. තවද, සමස්තයක් ලෙස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ණය පොලී අනුපාතිකවල අඩු වීම ප්‍රධාන වශයෙන් විශාල පරිමාණයේ ණය සඳහා වූ පොලී අනුපාතික අඩු වීම හේතුවෙන් සිදු විය. එමගින් ද, ලිහිල් මුදල් තත්ත්වයන්ගේ ප්‍රතිලාභ කුඩා පරිමාණ ණය ලබාගන්නන් වෙත සම්පූර්ණයෙන් සම්ප්‍රේෂණය වී නොමැති බව පෙන්නුම් කරයි.

**13 රූප සටහන: තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල වෙනස්වීම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**04 සංඛ්‍යා සටහන: තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතික**

*වාර්ෂික %*

| අනුපාතිකය | 2023 අවසානය | 2024 ජූනි අවසානය | වෙනස (ප්‍රතිශතාංක) |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය | 9.24 | 8.75 | -0.49 |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (සතිපතා) | 12.13 | 8.78 | -3.35 |
| දින 364 භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතිකය | 12.93 | 10.31 | -2.62 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය | 14.21 | 12.47 | -1.74 |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය | 11.64 | 8.38 | -3.26 |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය | 11.06 | 7.24 | -3.82 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය | 14.38 | 11.45 | -2.93 |
| බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය | 14.96 | 12.25 | -2.71 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ලිහිල් මුදල් තත්ත්ව මෙන්ම ණය ප්‍රතිව්‍යුහගතකරණ උපායමාර්ග හා ආශ්‍රිත අවිනිශ්චිතතා අවම වීම, වෙළඳපොළ අපේක්ෂා වැඩි දියුණු වීම සහ සාමාන්‍යයක් ලෙස අඩු ප්‍රමාණයකින් වෙන්දේසි සඳහා රජයේ සුරැකුම්පත් ඉදිරිපත් කිරීම හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික අඛණ්ඩව අඩු විය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් වෙන්දේසි සඳහා රජයේ සුරැකුම්පත් වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කිරීම හේතුවෙන් 2024 ජූනි මස අග භාගයේ දී ඵලදා අනුපාතිකවල තාවකාලික ඉහළ යෑමක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2024 වසරේ ජූලි මස 17 දක්වා කාලය තුළදී භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික ප්‍රතිශතාංක 2.86-4.96ක් අතර පරාසයකින් අඩු විය.

වෙළඳපොළ නාමික පොලී අනුපාතික අඩු වුවද, පවතින අඩු උද්ධමන තත්ත්වයන් මධ්‍යයේ මූර්ත පොලී අනුපාතික අඛණ්ඩව ඉහළ ධන අගයක පවතී.

**14 රූප සටහන: මූර්ත පොලී අනුපාතික**




*සටහන: නාමික පොලී අනුපාතිකය සඳහා වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (කො.පා.මි.ද. මත පදනම් වූ) ගැළපීමෙන් මාසික මූර්ත පොලී අනුපාතිකය ගණනය කර ඇත.*

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව

***දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්වයන් 2024 වසරේ දී වැඩි දියුණු විය.***

2024 වසරේ මේ දක්වා කාලය තුළදී, විශේෂයෙන්ම අප්‍රේල් මාසයේ සිට ද්‍රවශීලතාව තිරසාර පදනමකින් අතිරික්ත මට්ටම් වාර්තා කිරීමත් සමඟ දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව වැඩි දියුණු විය. ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ විදේශ විනිමය ගනුදෙනු හරහා ද්‍රවශීලතාව සැපයීම මේ සඳහා හේතු විය. වැඩි දියුණු වූ ද්‍රවශීලතා මට්ටම් සහ දේශීය මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් සැලකිල්ලට ගනිමින්, මහ බැංකුව විසින් නිත්‍ය පහසුකම් භාවිතය සඳහා පනවා තිබූ සීමා 2024 පෙබරවාරි මස ලිහිල් කළ අතර, 2024 අප්‍රේල් මාසයේ දී එම සීමාවන් සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලදී. තවද, 2024 මැයි සහ ජූනි මස මුල් කාලයේ දී ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම සැලකිය යුතු ලෙස සීමා කරන ලදී. කෙසේ වෙතත්, 2024 ජූලි මස මුල් කාලය වන විට, මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් කල්පිරීම සහ රජය විසින් මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් සඳහා වන කූපන් ගෙවීම් හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළ තුළ අතිරික්ත ද්‍රවශීලතා මට්ටම් (එක්දින සහ ව්‍යුහාත්මක) සාමාන්‍යයක් ලෙස 2024 මැයි මාසයේ දී වාර්තා වූ මට්ටම්වලට සාපේක්ෂව අඩු විය. ද්‍රවශීලතා අතිරික්තයෙහි මෙම පහළ යෑම කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ යෑමට යම් පීඩනයක් ඇති කළේය. එබැවින්, ද්‍රවශීලතා තත්ත්වයෙහි නිශ්චිතභාවයක් සැපයීමට සහ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව මුදල් වෙළඳපොළ පොලී අනුපාතික පහළ යෑම සඳහා අනුබල සැපයීමට මහ බැංකුව විවට වෙළඳපොළ කටයුතු සිදු කිරීම හරහා වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සපයන ලදී. සමස්තයක් ලෙස දේශීය මුදල් වෙළඳපොළ තුළ ද්‍රවශීලතා අතිරික්තයක් පැවතිය ද, වෙළඳපොළ සහභාගීවන්නන් අතර ද්‍රවශීලතා ව්‍යාප්තිය අසමමිතිකව පවතී.

**15 රූප සටහන: එක්දින ද්‍රවශීලතාව, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය**







මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට සහ දේශීය මුදල් වෙළඳපොළ වැඩිදියුණු වූ ද්‍රවශීලතා තත්ත්වයන්ට අනුකූලව බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ පහළ සීමාව ආසන්නයේ අඛණ්ඩව පැවතුණි. ඒ අනුව, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 2024 ජූලි මස 23 වන විට සියයට 8.76ක් විය. [11]

## දේශීය ණය තත්ත්ව සහ මුදල් සැපයුම

***බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ක්‍රමයෙන් ඉහළ යෑම සහ බැංකු අංශයේ ශුද්ධ විදේශීය වත්කම් ප්‍රසාරණය වීම හේතුවෙන් 2024 වසරේ මේ දක්වා කාලය තුළදී පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) අඛණ්ඩව ප්‍රසාරණය විය.***

2024 වසරේ මුල් කාලයේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණයෙහි යම් විචලනයන් පැවතියද 2024 මැයි සහ ජූනි මාසවලදී සැලකිය යුතු ණය ප්‍රසාරණයක් වාර්තා කළේය. පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය 2024 ජූනි මස අවසානය වන විට සියයට 6.2ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් වසරේ පළමු භාගය තුළ දී රුපියල් බිලියන 146කින් ප්‍රසාරණය විය. ණය ප්‍රසාරණය ප්‍රධාන වශයෙන් පරිභෝජන අවශ්‍යතා සඳහා යොමු වුවද, ආර්ථිකයේ අනෙකුත් ප්‍රධාන අංශ වෙත ද ණය සැපයීමේ ද වර්ධනයක් දක්නට ලැබුණි. 2024 වසරේ මේ දක්වා කාලය තුළදී පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රසාරණය මන්දගාමී වීම සඳහා ඇතැම් වෙළඳපොළ ණය උපකරණවල පොලී අනුපාතික සාපේක්ෂව ඉහළ අගයක පැවතීමත් සමඟ ආර්ථිකය තුළ ණය සඳහා වන ඉල්ලුම අඩුවීම යම්තාක් දුරකට හේතු වුවද, විශේෂයෙන්ම කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වෙත සපයන ලද ණය හා සම්බන්ධ ඉහළ අවදානම් අධිමිල වැනි ණය සැපයුම් අංශයේ පැවති බාධාවන් ද මේ සඳහා දායක වී ඇත.

[11] 2024 ජූලි 24 වැනි දින ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 25කින් අඩු කිරීමත් සමඟ, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය තවදුරටත් අඩු වී 2024 ජූලි මස අවසානය වන විට සියයට 8.55ක් ලෙස වාර්තා විය.

**16 රූප සටහන: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි මාසික වෙනස්වීම**




සටහන: 2022 මාර්තු-මැයි කාලය තුළ එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම, එම කාලය තුළ මුදල් හා ණය සමස්තවල සැලකිය යුතු ප්‍රසාරණය සඳහා දායක විය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රධාන වශයෙන් මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණ සංකෝචනය වීම හේතුවෙන් 2024 පළමු භාගය තුළදී බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණ සංකෝචනය වූ අතර, රජයේ සුරැකුම්පත් මත සිදු කරන ලද ආයෝජන ඉහළ යෑම පිළිබිඹු කරමින් බලත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ඉහළ ගියේය. මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් කල්පිරීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිත්‍ය ණය පහසුකම භාවිතය අඩු වීම හේතුවෙන් 2024 වසරේ පළමු භාගය තුළදී මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය අඩු විය.

**17 රූප සටහන: මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය (මාසික වෙනස්වීමෙහි මුහුණත අගය)**




*ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි 129(2) වගන්තියට අනුව රජය විසින් ලබා ගන්නා ලද තාවකාලික අත්තිකාරම් භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කිරීම ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යාපාර ශුද්ධ පදනම මත නැවත ණය පියවීම මෙන්ම, සලකා බලන කාල සීමාව තුළ රුපියල අතිප්‍රමාණය වීමෙන් ඇතිවන වටිනාකම් වෙනස්වීමේ බලපෑම හේතුවෙන් 2024 වසරේ පළමු භාගය තුළදී බලත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය ප්‍රමාණ සංකෝචනය විය.

2020 අප්‍රේල් මාසයෙන් පසුව පළමු වරට ධන අගයක් වාර්තා කරමින් 2024 වසරේ පළමු භාගය තුළදී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් සැලකිය යුතු ලෙස වර්ධනය විය. අනේවාසිකයින් සඳහා වූ විදේශ විනිමය පියවීම් සිදු කරන අතරම විදේශීය වත්කම් ඉහළ යෑම හේතුවෙන් බලත්‍රලාභී වාණිජ බැංකු සතු ශුද්ධ විදේශීය

වත්කම් වර්ධනය විය. විදේශීය අංශයේ කාර්යසාධනය වැඩි දියුණු වීම මධ්‍යයේ දළ නිල සංචිත ඉහළ නංවා ගනිමින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම හේතුවෙන් මහ බැංකුව සතු ශුද්ධ විදේශීය වත්කම් වර්ධනය විය.

මෙම ප්‍රවණතා මෙන්ම පවත්නා ලිහිල් වූ මුදල් තත්ත්වය සමඟ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) අඛණ්ඩව වර්ධනය වූ අතර 2024 ජූනි මස අවසානය වන විට සියයට 9.8ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය.

**05 සංඛ්‍යා සටහන: පුළුල් මුදල් ($M_{2b}$) සැපයුමේ සංරචක**

| | | 2022 | 2023 | 2024 | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | පළමු අර්ධය |
| **ශුද්ධ විදේශීය වත්කම්** | වෙනස්වීම (රු. බිලියන) | -784.8 | 1,310.7 | 56.1 | 79.7 | 148.1 | 119.3 | 146.8 | 86.3 | 636.3 |
| **රජය වෙත සපයන ලද ශුද්ධ ණය** | වෙනස්වීම (රු. බිලියන) | 1,638.7 | 813.9 (අ) | 50.1 | -18.1 | -60.4 | -26.2 | -75.8 | -65.6 | -196.1 |
| **රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබාදුන් ණය** | වෙනස්වීම (රු. බිලියන) | 561.6 | -979.9 (අ) | -22.8 | -14.0 | -19.8 | -11.8 | -0.2 | 8.2 | -60.4 |
| **පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය** | වෙනස්වීම (රු. බිලියන) | 430.0 | -45.0 | -52.2 | 7.3 | 71.9 | -16.2 | 60.7 | 74.5 | 145.9 |
| | වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (%) | 6.2 | -0.6 | -0.02 | 0.9 | 3.6 | 4.1 | 6.3 | 6.2 | |
| **පුළුල් මුදල් සැපයුම ($M_{2b}$)** | වෙනස්වීම (රු. බිලියන) | 1,642.3 | 899.5 | -74.2 | 86.2 | 123.5 | 95.4 | 196.4 | 131.5 | 558.8 |
| | වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (%) | 15.4 | 7.3 | 6.4 | 6.9 | 8.4 | 8.3 | 10.6 | 9.8 | |

(අ) 2023 ජනවාරි 30 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඇපකර යටතේ පැවති නොපියවූ විදේශ විනිමය ණය 2022 දෙසැම්බර් මාසයේ සිට මධ්‍යම රජයේ ණය ලෙස සලකන ලදී. ඒ අනුව, මෙම ගැළපීම අදියර දෙකකින් ක්‍රියාත්මක කරමින් ප්‍රථමයෙන් 2023 අප්‍රේල් මාසයේදී සහ ඉන් අනතුරුව 2023 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලද අතර එය අදාළ රාජ්‍ය බැංකුවල ශේෂ පත්‍රවල පිළිබිඹු වේ. මේ හේතුවෙන්, රාජ්‍ය සංස්ථා/රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය අඩු වූ අතර රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ ගියේය.

සටහන: වාර්ෂික වෙනස්කම් 2022 සහ 2023 වසර සඳහා ඉදිරිපත් කර ඇති අතර, මාසික වෙනස්කම් 2024 ජනවාරි-ජූනි තීරුවල ඉදිරිපත් කර ඇත. අවසාන තීරුවේ 2024 වර්ෂයේ පළමු භාගයේ වෙනස දක්වා ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**18 රූප සටහන: පුළුල් මුදල්වල ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා දායකත්වය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 3.4 විදේශීය අංශය

***2024 වසරේ පළමු කාර්තුව තුළ දී, ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කරමින් 2024 වසරේ මේ දක්වා කාලය තුළ දී විදේශීය අංශයේ ධනාත්මක ප්‍රවණතාවයක් දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු වීම හේතුවෙන්, අවසාන කාලපරිච්ඡේදය තුළ යම් අවප්‍රමාණය වීමේ පීඩනයක් පැවතුණද 2024 වසරේ පළමු භාගයේ දී ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය විය.***

### ගෙවුම් තුලනය

2024 වසරේ පළමු කාර්තුව තුළ දී ජංගම ගිණුමේ එ.ජ. ඩොලර් මිලියන 706ක අතිරික්තයක් වාර්තා විය. වෙළඳ සහ ප්‍රාථමික ආදායම් ගිණුම් හිඟය පුළුල් වුවද සේවා අපනයන සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම මේ සඳහා සහාය විය. 2024 වසරේ පළමු භාගය තුළ දී වෙළඳ හිඟය එ.ජ. ඩොලර් බිලියන 2.5ක් දක්වා පුළුල් විය. මෙම වසරේ අදාළ කාල සීමාව තුළ දී අපනයන ඉපැයීම් සහ ආනයන වියදම් යන දෙඅංශයම 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. වෙළඳ භාණ්ඩ අපනයනවල වර්ධනයට ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, රබර් නිෂ්පාදිත, සහ තේ ආදී වූ අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. වෙළඳ භාණ්ඩ ආනයනවල වර්ධනයට ප්‍රධාන වශයෙන් යන්ත්‍රසූත්‍ර හා උපකරණ, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, රසායනික නිෂ්පාදිත, සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආදී වූ ආනයන ඉහළ යෑම හේතු විය. පාරිභෝගික ඉල්ලුමෙහි අපේක්ෂිත වැඩිවීම සහ තවදුරටත් පවතින ආනයන සීමාවන් ක්‍රමානුකූලව ලිහිල් කිරීම සමඟ වසරේ දෙවන භාගය තුළ දී වෙළඳ හිඟය පුළුල් විය හැකිය.

**19 රූප සටහන: වෙළඳ ගිණුම**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

2024 වසරේ පළමු භාගය තුළ දී මිලියනය ඉක්මවා සංචාරක පැමිණීම් වාර්තා කිරීමත් සමඟ සේවා ගිණුමෙහි සංචාරක ඉපැයීම් සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. 2024 වසරේ පළමු භාගය තුළ දී මුහුදු ප්‍රවාහන සේවා, පරිගණක සේවා සහ තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා වැනි අනෙකුත් සේවා අංශ වෙත වූ ලැබීම්වල වර්ධනයක් වාර්තා විය. මේ අතර, 2024 වසරේ පළමු භාගය තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. 2024 වසරේ දෙවන භාගයේ දී සේවා අංශය වෙත වූ ලැබීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඛණ්ඩව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය වෙළඳ හිඟයේ අපේක්ෂිත පුළුල්වීම සමනය කිරීමට උපකාරී වනු ඇත.

**20 රූප සටහන: විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සංචාරක කර්මාන්තය**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
බලපත්‍රලාභී බැංකු

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**21 රූප සටහන: ජංගම ගිණුම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වසරේ පළමු භාගය තුළ මූල්‍ය ගිණුමේ කාර්යසාධනය පහළ මට්ටමක පැවතුණි. 2024 වසරේ පළමු කාර්තුව තුළ විදේශීය සෘජු ආයෝජන ලැබීම් අඩු මට්ටමක පැවතුණි. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීම් වාර්තා විය. නොපියවා ඉතිරිව ඇති රාජ්‍ය සුරැකුම්පත්වල අනේවාසිකයන් සතු ආයෝජන දැනට ඉතා අඩු මට්ටමක පවතී. මේ අතර, ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන ලැබීම්, 2024 වසරේ පළමු භාගයේ දී සුළු ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

**22 රූප සටහන: මූල්‍ය ගිණුම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකය

2024 වසරේ මැයි සහ ජූනි මාසවල දී යම් අවප්‍රමාණය වීමේ පීඩනයක් පැවතිය ද, 2023 වසරේ අග භාගයේ සිට ශ්‍රී ලංකා රුපියලෙහි දක්නට ලද අතිප්‍රමාණය වීමේ ප්‍රවණතාවය 2024 වසරේ මේ දක්වා පැවතුණි. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් වූ ඉහළ විදේශීය ලැබීම්, ඉහළ ගිය සේවා අපනයන, වෙළඳ භාණ්ඩ අපනයනකරුවන්ගේ ආදායම් රුපියල් බවට පරිවර්තනය කිරීම් සහ වෙළඳපොළ අපේක්ෂාවන් අඛණ්ඩව වැඩිදියුණු වීම සමඟ 2024 වසරේ පළමු භාගයේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන්

වැඩිදියුණු විය. 2024 වසරේ ජූලි මස 23 දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සමස්තයක් ලෙස සියයට 6.6කින් අතිප්‍රමාණය විය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් ආනයන ගෙවීම් සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ ශුද්ධ ගෙවීම් වැඩි වීම හේතුවෙන් 2024 වසරේ මැයි සහ ජූනි මාසවලදී යම් අවප්‍රමාණය වීමේ පීඩනයන් දක්නට ලැබුණු අතර, ඒ අනුව දවස තුළ දී සිදුවන උච්චාවචනයන් අවම කිරීම සඳහා මහ බැංකුවට ඇතැම් දිනවල වෙළඳපොළ වෙත විදේශ විනිමය සැපයීමේ අවශ්‍යතාවය මතුවිය. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2024 වසරේ ජූලි මස 23 දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල යූරෝ, ස්ටර්ලින් පවුම, චීන යුවාන්, ජපන් යෙන්, ඉන්දියානු රුපියල, සහ ඕස්ට්‍රේලියානු ඩොලරය වැනි අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**23 රූප සටහන: විනිමය අනුපාතිකයෙහි හැසිරීම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංචිත වත්කම්

විදේශීය අංශයේ හිතකර වර්ධනයන් පිළිබිඹු කරමින් 2024 වසරේ පළමු භාගය තුළදී දළ නිල සංචිත වර්ධනය විය. දළ නිල සංචිත 2023 වසරේ දෙසැම්බර් අවසානයේ එ.ජ. ඩොලර් බිලියන 4.4ක සිට 2024 වසරේ ජූනි මස අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 5.7ක් දක්වා වැඩි විය. චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම දළ නිල සංචිතවලට ඇතුළත් වන අතර, එය භාවිතා කිරීමේ කොන්දේසිවලට යටත් වේ. 2024 වසරේ මුල් මාස හය තුළ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් මහ බැංකුව විසින් සිදු කළ ශුද්ධ මිලදී ගැනීම් එ.ජ. ඩොලර් බිලියන 1.8ක් (වෙළඳ දිනය මත පදනම්ව) සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ දෙවන සමාලෝචනය අවසන් කිරීමෙන් පසුව ලද එ.ජ. ඩොලර් මිලියන 336ක් පමණ ලැබීම්, දළ නිල සංචිත වැඩිවීමට ප්‍රධාන වශයෙන් සහාය විය. මේ අතර, 2024 වසරේ ජූනි මස අවසන් වන විට දළ නිල සංචිතවල ආනයන ආවරණය (චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම ඇතුළුව) ආනයනික මාස 3.9ක් විය.

**24 රූප සටහන: දළ නිල සංචිත, සංචිත ප්‍රමාණාත්මකභාවය සහ ශුද්ධ මිලදී ගැනීම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 3.5 රාජ්‍ය මූල්‍ය අංශය[12]

***රජය විසින් ක්‍රියාත්මක කරන ලද ආදායම් මත පදනම් වූ ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග හේතුවෙන් 2024 වසරේ මැයි මාසයෙන් අවසන්වන මාස පහ තුළ දී රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය අඛණ්ඩව වර්ධනය විය. එම ක්‍රියාමාර්ග ප්‍රාථමික ශේෂයේ සැලකිය යුතු අතිරික්තයක් සහ අඩු සමස්ත අයවැය හිඟයක් වාර්තා කිරීමට හේතු විය.***

ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වාගෙන යෑම හේතුවෙන් 2024 වසරේ මැයි මාසයෙන් අවසන් වන මාස පහ තුළ දී නාමික වශයෙන් සහ පුරෝකථනය කළ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත අයවැය ශේෂය, වර්තන ගිණුමේ ශේෂය සහ ප්‍රාථමික ශේෂයන් යන ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්වල දියුණුවක් ඇති විය. 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2024 වසරේ මැයි මාසයෙන් අවසන් වන මාස පහ තුළ දී රජයේ ආදායම හා ප්‍රදාන සැලකිය යුතු ලෙස වැඩි විය. එකතු කළ අගය මත බද්ද සහ නිෂ්පාදන/සුරා බදු සඳහා සිදු කරන ලද මෑතකාලීන ප්‍රතිසංස්කරණ මගින් ඉහළ ගිය බදු ආදායම රජයේ ආදායම වර්ධනයට මූලික වශයෙන් දායක විය. තවද, වැඩි දියුණු වූ ආර්ථික ක්‍රියාකාරකම්වල බලපෑම හේතුවෙන් මෙන්ම ආදායම් බදු සඳහා වෘත්තිකයන් ලියාපදිංචිවීම අනිවාර්ය කිරීම වැනි බදු පරිපාලන ක්‍රමවේද වැඩි දියුණු වීම හේතුවෙන් බදු පදනම පුළුල් වීම 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2024 වසරේ මැයි මාසයෙන් අවසන් වූ මාස පහ තුළ දී ආදායම් බදු එක්රැස් කිරීම ඉහළ යෑමට දායක විය. එමෙන්ම, සලකා බලන ලද කාල සීමාව තුළ දී ආනයන බදු එක්රැස් කිරීම ඉහළ යෑම සඳහා ආනයන සීමා ක්‍රමානුකූලව ලිහිල් කිරීම දායක විය. බදු පරිපාලනය වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග සහ ආදායම් එකතු කිරීමේ ආයතනවල ආයතනික ප්‍රතිසංස්කරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීම මගින් බදු ආදායම් එක්රැස් කිරීමෙහි කැපී පෙනෙන වර්ධනයක් තවදුරටත් අපේක්ෂා කෙරෙන අතර, එම ක්‍රියාමාර්ග මැදි කාලීනව ආදායම් වර්ධන වේගය පවත්වාගෙන යෑම සඳහා ද තීරණාත්මක සාධකයන් වනු ඇත. 2024 වසරේ මැයි මාසයෙන් අවසන් වූ මාස පහ තුළ

[12] 2024 මැයි මස දක්වා වූ රාජ්‍ය මූල්‍ය දත්ත පමණක් ලැබී තිබුණි.

දී බදු නොවන ආදායම ද වර්ධනය වූ අතර, පොලී, ලාභ හා ලාභාංශ සහ ගාස්තු හා අය කිරීම් මගින් ලද ආදායම් ඉහළ යෑම මේ සඳහා හේතු විය.

මූලික වශයෙන් පොලී වියදම් පහත යෑම හේතුවෙන්, පෙර වසරේ අනුරූප කාලසීමාවට සාපේක්ෂව 2024 වසරේ මැයි මාසයෙන් අවසන් වන කාලසීමාව තුළ සුළු අඩුවීමක් වාර්තා කරමින් සමස්ත වියදම පාලනය වී පැවතුණි. රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික පහත වැටීම හේතුවෙන් සමස්ත වියදම කෙරෙහි විශාල ම දායකත්වය දක්වන පොලී වියදම් අඩු විය. මීට අමතරව, 2024 වසරේ සමාලෝචනයට භාජනය වන කාලය තුළ දී ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් ද 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සුළු වශයෙන් අඩු වී ඇත.

**25 රූප සටහන: ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්**




මූලය: මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

විදේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමට පවතින සීමා හේතුවෙන් 2024 වසරේ මැයි මාසයෙන් අවසන් වන කාලසීමාව තුළ දී අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා රජය මූලිකවම දේශීය මූලාශ්‍ර මත තවදුරටත් රඳා පැවතුණි. මේ අතර, දේශීය ණය තොගය ඉහළ ගිය ද, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම හේතුවෙන් විදේශීය ණය තොගයේ වටිනාකම අඩු වීම හේතුවෙන් මධ්‍යම රජයේ නොපියවූ ණයෙහි[13] රුපියල් අගය 2023 වසර අවසානයට සාපේක්ෂව 2024 වසරේ මැයි මස අවසානය වන විට පහළ ගියේය.

දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන සාර්ථකව නිම කිරීමෙන් පසුව, රජය විසින් 2024 වසරේ ජූනි මාසයේ දී නිල ණයහිමියන්ගේ කමිටුව (Official Creditor Committee) සහ චීන එක්සිම් බැංකුව (Exim Bank of China) සමඟ එ.ජ. ඩොලර් බිලියන 10ක ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුමකට එළඹුන අතර, බැඳුම්කර හිමියන්ගේ තාවකාලික හවුල (Ad-Hoc Bondholder Group) සමඟ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් ද ප්‍රගතියක් අත් කරගෙන ඇත. ණය ප්‍රතිව්‍යුහගත කිරීම ඉක්මනින් අවසන් කිරීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය වර්ධනය කිරීමටත්, ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීමට සහ අනාගත ආර්ථික වර්ධනය සඳහා ස්ථාවර පදනමක් සැපයීමටත් හේතු වනු ඇත.

[13] මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 දින ශ්‍රී ලංකාවේ විදේශීය ණය සේවාකරණය සම්බන්ධ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු ගෙවීමට නියමිතව තිබූ ණය සේවාකරණ ගෙවීම් කිහිපයක් මධ්‍යම රජයේ ණය ඇස්තමේන්තුවලට ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක් වූ විදේශ ණය කාණ්ඩවල, ගෙවීමට නියමිතව තිබූ, එහෙත් නොගෙවන ලද පොලී ගෙවීම් මෙම ණය සේවකරණ ගෙවීම්වලට ඇතුළත් වේ.

**06 සංඛ්‍යා සටහන: රාජ්‍ය මූල්‍ය කටයුතු: 2024 ජනවාරි-මැයි**

*රුපියල් බිලියන*

| අයිතමය | 2023 (අ) | 2023 ජනවාරි - මැයි | 2024 ජනවාරි - මැයි | 2024 ජනවාරි-මැයි /2023 ජනවාරි-මැයි වෙනස (%) |
|---|---|---|---|---|
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **3,074.3** | **1,122.4** | **1,619.2** | 44.3 |
| මුළු ආදායම | 3,048.8 | 1,120.6 | 1,616.8 | 44.3 |
| බදු ආදායම | 2,720.6 | 1,029.4 | 1,491.2 | 44.9 |
| බදු නොවන ආදායම | 328.3 | 91.2 | 125.5 | 37.6 |
| ප්‍රදාන | 25.5 | 1.8 | 2.5 | 36.8 |
| **මුළු වියදම්** | **5,356.6** | **2,137.1** | **1,986.0** | -7.1 |
| පුනරාවර්තන වියදම් | 4,699.7 | 1,937.9 | 1,792.8 | -7.5 |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම් | 656.9 | 199.2 | 193.2 | -3.0 |
| **වර්තන ගිණුමේ ශේෂය** | **-1,650.9** | **-817.3** | **-176.0** | |
| **ප්‍රාථමික ශේෂය** | **173.3** | **47.4** | **554.2** | |
| **සමස්ත අයවැය ශේෂය** | **-2,282.3** | **-1,014.7** | **-366.8** | |
| **සමස්ත මූල්‍යනය** | **2,282.3** | **1,014.7** | **366.8** | |
| විදේශීය මූල්‍යනය | 494.7 | -63.3 | -27.6 | |
| දේශීය මූල්‍යනය | 1,787.6 | 1,078.0 | 394.4 | |
| | 2023 අවසානයට | 2023 මැයි අවසානයට | 2024 මැයි අවසානයට | |
| **මධ්‍යම රජයේ නොපියවූ ණය (ආ)** | **28,695.9** | **26,080.1** | **28,062.8** | |
| දේශීය ණය | 17,051.9 | 15,671.3 | 17,349.5 | |
| විදේශීය ණය | 11,644.1 | 10,409.3 | 10,713.3 | |

(අ) තාවකාලික

(ආ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය පිළිබඳ අන්තර් කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යම රජයේ නොගෙවූ ණය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවේ. අන්තර් කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක් වූ විදේශ ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු, ගෙවීමට නියමිත පොලී ගෙවීම් මෙම නොගෙවූ ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ. තවද, 2014 වසරේ දී ජා .මූ. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රජයේ මූල්‍ය සංඛ්‍යා ලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව නේවාසිකත්වය මත පදනම්ව (නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජන දේශීය ණය යටතේ වර්ගීකරණය කිරීම, අනේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන විදේශීය ණය යටතේ වර්ගීකරණය කිරීම යනාදී වශයෙන්) ණය ඇස්තමේන්තුව සකස් කර ඇති අතර ශුද්ධ පදනම මත (තැන්පතු ගැළපුම් කළ පසු) එය ඉදිරිපත් කර ඇත.

මූලය: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

## 3.6 මූල්‍ය අංශය

***2024 වසරේ මේ දක්වා කාලය තුළ සාර්ව මූල්‍ය තත්ත්ව වැඩිදියුණු වී ඇති අතර, පසුගිය කාලපරිච්ඡේදය තුළ පැවති අහිතකර සාර්ව මූල්‍ය තත්ත්වයන්ගේ කල්පවත්නා බලපෑම් අඛණ්ඩව අභියෝග එල්ල කරයි.***

මූර්ත ආදායම පහත වැටීමේ දිගු කාලීන බලපෑම කුටුම්භ හා ව්‍යාපාර ණය ආපසු ගෙවීමේ හැකියාවට බාධාවක් වී ඇති අතර, එමගින් මූල්‍ය අංශයේ ණය අවදානම ඉහළ ගොස් ඇත. මේ අතර, දද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික අංශයේ ණය අනුපාත පරතරය (ණය පරතරය) මගින් පිළිබිඹු කෙරෙන ණය චක්‍රය ප්‍රසාරණ අවධියකට අවතීර්ණ වී ඇති බව පෙන්නුම් කරයි. පෞද්ගලික අංශයට ලබාදෙන ණය යථා තත්ත්වයට පත්වීම මෙන්ම අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සමඟ රාජ්‍ය අංශයට මූල්‍ය ආයතන නිරාවරණය වීමේ නැඹුරුව අඩුවෙමින් පවතී.

**26 රූප සටහන: ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස ණය පරතරය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**27 රූප සටහන: රජය සහ පෞද්ගලික අංශය වෙත නිරාවරණය වීම***




*බැංකු අංශයෙහි සහ බලපත්‍රලාභී මුදල් සමාගම්, රජය පෞද්ගලික අංශය වෙත වන නිරාවරණය මෙමගින් නිරූපනය කරයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

යහපත් වූ සාර්ව ආර්ථික තත්ත්ව හමුවේ 2024 වසරේ පළමු භාගය තුළ දී මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ක්‍රමයෙන් වැඩිදියුණු විය. ප්‍රධාන වශයෙන් ආයෝජන වැඩි වීම සහ ණය සහ ලැබිය යුතු මුදල්වල වර්ධනය හේතුවෙන් සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී බැංකු අංශයේ මුළු වත්කම් ප්‍රසාරණය විය. ඒ අනුව, 2024 වසරේ ජූනි මාසය අවසන් වන විට බැංකු අංශයේ වත්කම් සියයට 7.9ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් රුපියල් ට්‍රිලියන 20.7ක් විය. ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මධ්‍යයේ, බැංකු අංශයේ දළ ණය සහ ලැබිය යුතු මුදල් 2024 ජූනි මාසය අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 4.8කින් ප්‍රසාරණය විය.

ප්‍රධාන වශයෙන් පොලී වියදම් සැලකිය යුතු ලෙස අඩුවීම හේතුවෙන් 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2024 වසරේ පළමු භාගය තුළ දී බැංකු අංශයේ බදු පසු ලාභය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, බැංකු අංශය විසින් බදු පසු ලාභය ලෙස 2023 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ රුපියල් බිලියන 80.5ට සාපේක්ෂව 2024 වසරේ පළමු භාගය තුළ දී රුපියල් බිලියන 112.2ක් විය. අදියර 3 ණය අනුපාතය තුළින් පිළිබිඹු වන බැංකු අංශයේ සමස්ත ණය පැහැර හැරීමේ අවදානම, 2023 වසරේ ජූනි මාසයේ අග වාර්තා වූ සියයට 13.5ට සාපේක්ෂව 2024 ජූනි මාසය අවසානයේ දී සියයට 12.8ක් දක්වා අඩු විය. 2023 වසසරේ ජූනි මාසයේ සිට 3 වන අදියරේ ණයවල වර්ධනය ද අඩුවෙමින් පවතින අතර, එමගින් බැංකු අංශයේ ණය අවදානම ස්ථාවර වීමක් පෙන්නුම් කෙරේ.

ද්‍රවශීලතා ආවරණ අනුපාතය (Liquidity Coverage Ratio) සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය (Net Stable Funding Ratio) මගින් මනිනු ලබන බැංකු අංශයේ ද්‍රවශීලතා තත්ත්වය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2024 වසරේ ජූනි මාසය අවසානය වන විට සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. බැංකු අංශයේ රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2023 වසරේ ජූනි මාසය අවසානයේ පැවති සියයට 276.0ක අගයට සාපේක්ෂව 2024 වසරේ ජූනි මාසය අවසානය වන විට සියයට 339.9ක් දක්වා වර්ධනය වී ඇති අතර, එය අවම නියාමන අවශ්‍යතාවය වන සියයට 100ට වඩා ඉතා ඉහළ මට්ටමක පැවතුණි. අවදානම් බරිත වත්කම්වල (Risk Weighted Assets) ඉහළ යෑමක් පෙන්නුම් කළ ද, නියාමන ප්‍රාග්ධනයේ වර්ධනය ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස, 2023 ජූනි මාසය අවසානයේ පැවති සියයට 16.9ට සාපේක්ෂව බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය 2024 ජූනි මාසය අවසානය වන විට සියයට 18.0ක් දක්වා වර්ධනය විය. අනාගතයේ ඇති විය හැකි අලාභ අවශෝෂණය කර ගැනීමට බැංකු සතු හැකියාව ශක්තිමත් කිරීමට හේතුවන ප්‍රාග්ධන ස්වාරක්ෂක වැඩිදියුණු වීම නිරූපණය කරමින්, බැංකුවල නියාමන ප්‍රාග්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් සියයට 11.0ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.

ප්‍රධාන වශයෙන් මූල්‍ය කල්බදු, උකස්/රන් ණය සහ පුද්ගල ණය ඉහළ යෑම හේතුවෙන් 2024 වසරේ පළමු භාගයේ දී බලපත්‍රලාභී මුදල් සමාගම් අංශය සිය ණය සහ අත්තිකාරම් කළඹෙහි සියයට 12.6ක වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රසාරණයක් වාර්තා කළේය. ණය පැහැර හැරීමේ අවදානමෙහි පහළ යෑමක් පෙන්නුම් කරමින්, මෙම අංශයේ සමස්ත ණය සඳහා අදියර 3 දළ ණය අනුපාතය, 2023 වසරේ ජූනි මාසය අවසානයේ පැවති සියයට 20.3ට සාපේක්ෂව, 2024 වසරේ ජූනි මාසය අග වන විට සියයට 13.6ක් දක්වා අඩු විය. ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල සිදු කරන ලද ආයෝජන ඉහළ යෑම හේතුවෙන් මෙම අංශයේ ද්‍රවශීලතා තත්ත්වය නියාමන අවශ්‍යතාවට වඩා ඉහළින් පැවතුණි.

මේ අතර, කොටස් වෙළෙඳපොළ සමස්ත වෙළඳපොළ මිල දර්ශකය (ASPI) සහ එස් ඇන්ඩ් පී 20 දර්ශකය (S&P SL 20) පසුගිය වසර අවසානයට සාපේක්ෂව, 2024 ජූනි මස අවසන් වන විට, පිළිවෙළින්, සියයට 14.0ක සහ සියයට 17.0ක වර්ධනයන් වාර්තා කරමින් ධනාත්මක කාර්යසාධනයක් පෙන්නුම් කළේය.

## 3.5 ගෝලීය ප්‍රවණතා

***ගෝලීය ආර්ථික වර්ධනයෙහි ස්ථාවර වීමක් පෙන්නුම් කළද, උද්ධමනය පහත යෑම මන්දගාමී වීම මධ්‍යයේ ගෝලීය මුදල් ප්‍රතිපත්තිය සාමාන්‍යකරණය කිරීමට අදාළව අවිනිශ්චිතතා පවතී.***

උද්ධමන ඉදිරි දැක්ම පිළිබඳ අවිනිශ්චිතතාව හේතුවෙන් මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ වේගය අපේක්ෂිත මට්ටමට වඩා මන්දගාමී වී ඇත. කෙසේ වෙතත්, ආර්ථික ක්‍රියාකාරකම් ස්ථාවර කිරීම සහ උත්තේජනය කිරීම කෙරෙහි වන අවධානය ඉහළ යෑමත් සමඟ, ඉදිරි කාලයේ දී විශේෂයෙන් ප්‍රධාන දියුණු ආර්ථිකයන්හි මහ බැංකු විසින් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරත්වයක් වෙත යොමුවනු ඇතැයි අපේක්ෂා කළ හැකිය. ලෝක ආර්ථික ඉදිරි දැක්ම (World Economic Outlook) 2024 ජූලි මස යාවත්කාලීන වාර්තාවට අනුව, 2024 සහ 2025 යන වසර තුළ දී ගෝලීය ආර්ථික වර්ධනය ස්ථාවරව පවතිනු ඇති අතර, සේවා ආශ්‍රිත උද්ධමනය සහ වෙළඳ භාණ්ඩ මිල ඉහළ මට්ටමේ පැවතීම හේතුවෙන් 2024 සහ 2025 වසරවල දී උද්ධමනය පහත යෑමේ වේගය මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**28 රූප සටහන: ගෝලීය ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස්වීම්**




(අ) සංශෝධිත

මූලය: https://www.cbrates.com

ගෝලීය බලශක්ති සහ ආහාර මිල ගණන් ඒවායේ පවතින අසමතුලිත ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් හේතුවෙන් උච්චාවචනය වෙමින් පවතී. මැද පෙරදිග පවතින භූ දේශපාලනික අර්බුද මෙන්ම ආර්ථික යථා තත්ත්වයට පත්වීමත් සමඟ වර්ධනය වන ගෝලීය ඉල්ලුම හේතුවෙන් ගෝලීය බලශක්ති මිල ගණන් ඉහළ යාමේ අවදානමක් පවතී. වැඩිවන යෙදවුම් පිරිවැය ද මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවයට දායක වන අතර, කාලගුණය ආශ්‍රිත අවහිරතා හේතුවෙන් බලශක්ති සැපයුමේ සැලකිය යුතු අස්ථාවරත්වයක් ඇති විය හැකිය. මේ අතර, ගෝලීය ආහාර මිල දර්ශකය මාස තුනක් මුළුල්ලේ අඛණ්ඩව ඉහළ යෑම් වාර්තා කිරීමෙන් පසුව 2024 ජූනි මාසයේ දී නොවෙනස්ව පැවතුණි.

## 26 රූප සටහන: ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන්




මූලයන්: රොයිටර්ස්, බ්ලූම්බර්ග් තොරතුරු සේවය, සෞදි ඇරම්කො




මූලය: ආහාර හා කෘෂිකර්ම සංවිධානය

ISBN 978-624-5917-77-8